# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය 2021



**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය

# 2021

# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය

# 2021

NATIONAL LIBRARY OF SRI LANKA
NLSL

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අධ්‍යාපන අමාත්‍යාංශය

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2021
ISBN 978-624-5747-00-9

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය 2021. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2021
පි. xiii, 80 ; සෙමී. 30

ISBN 978-624-5747-00-9

i. 028.9095493 ඩිවි 23

1. කියවීමේ පුරුදු - ශ්‍රී ලංකාව - සමීක්ෂණ
2. මහජන පුස්තකාල - ශ්‍රී ලංකාව - සමීක්ෂණ
3. පුස්තකාල විද්‍යාව

**සම්පාදන උපදේශකත්වය**

සොනාල ගුණවර්ධන - සභාපති
ඩබ්ලිව්. සුනිල් - අධ්‍යක්ෂ ජනරාල්
පද්මා බණ්ඩාරනායක - අධ්‍යක්ෂ
මෛත්‍රී ජයසුන්දර - සහකාර අධ්‍යක්ෂ

**දත්ත විශ්ලේෂණය හා වාර්තාව සම්පාදනය සඳහා උපදෙස්**

මහාචාර්ය ඩබ්ලිව්. එන්. වික්‍රමසිංහ
හිටපු අංශ ප්‍රධාන - සංඛ්‍යාන අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය ඒ. ඒ. සුනේත්‍රා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංඛ්‍යාන අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**දත්ත පදනම නිර්මාණය, විශ්ලේෂණය හා වාර්තාව ලිවීම**

උදිත ගුණසේකර - පර්යේෂණ නිලධාරි

**පර්යේෂණය සැලසුම් කිරීම, ප්‍රශ්නාවලිය සැකසීම හා දත්ත රැස් කිරීම**

ආචාර්ය ජී. ඩී. අමරසිරි - හිටපු අධ්‍යක්ෂ, ජා. පු. හා ප්‍ර. සේ. ම.
කමලාංගනී සුබසිංහ - පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී
ජී. එච්. මංගල - පුස්තකාල සංවර්ධන සහකාර

**සහායක කාර්ය මණ්ඩලය**

සී. එම්. සෆීක් - තොරතුරු සහකාර
ලිෂ්විනී රාජරත්නම් - තොරතුරු සහකාර
ලෝෂිනි පණ්ඩාරම් - තොරතුරු සහකාර
අසෝකා දමයන්ති - කළමනාකරණ සහකාර
ආර්. ලෝගේෂ්වරී - කළමනාකරණ සහකාර

**පිටු සැකැස්ම හා පිටකවර නිර්මාණය**

තනුජා රංගිකා - කළමනාකරණ සහකාර

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක. 14, නිදහස් මාවත, කොළඹ 07.

දුරකථන : +94 11-3056388
ෆැක්ස් : +94 11-2685201
ඊ මේල් : research@mail.natlib.lk
වෙබ් : www.natlib.lk

# පෙරවදන

රටක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ දී දැනුම අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගත හැකි වේ. ''කියවීම'' දැනුම ලබා ගැනීමේ වැදගත් ප්‍රභවයකි. කියවීමේ මූලික පරමාර්ථය වනුයේ මිනිසුන්ව ක්‍රියාශීලීව හා නිර්මාණාත්මක වීමට අවශ්‍යය සහාය ලබාදීමයි. එවැනි පසුබිමක ජාතික මට්ටමින් කියවීම ප්‍රවර්ධනය කිරීම පිණිස විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. කියවීමේ ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම, පාඨක ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම, සමීක්ෂණ සිදු කිරීම හා ජාත්‍යන්තර සංවිධාන / ආයතන සමග සහයෝගයෙන් ජාතික වැඩසටහන් දියත් කිරීම ඉන් කිහිපයකි.

ශ්‍රී ලංකාවේ සියලු පළාත් පාලන ආයතන නියෝජනය කරමින් ව්‍යාප්තව පවත්නා මහජන පුස්තකාල පරිශීලනය කරන පාඨක ප්‍රජාව සහභාගී කරගනිමින් ඔවුන්ගේ කියවීමේ රුචිකත්වය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේ. එම සමීක්ෂණය පාදක කර ගනිමින් සකස් කර ඇති ''ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය 2021'' වාර්තාව ඉතා අගය කොට සලකන අතර මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිගමන හා යෝජනා ප්‍රතිපත්ති සම්පාදකයින්, අධ්‍යාපනඥයින්, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයින් හා පර්යේෂකයින් හට මෙන්ම මේ පිළිබඳ කැමැත්තක් දක්වන වෙනත් පිරිසට ද වැදගත් වේ.

සමීක්ෂණය සඳහා පුස්තකාල ආශ්‍රයෙන් දත්ත රැස් කිරීමට සහයෝගය ලබා දුන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්වරුන්ට, පළාත් පාලන කොමසාරිස්වරුන්ට, පලාත් පාලන ආයතනය ප්‍රධානීන්ට, ප්‍රජා සංවර්ධන නිලධාරීන්ට, පුස්තකාලයාධිපතිවරුන් ප්‍රමුඛ කාර්යමණ්ඩලයට පළමුව ස්තුතිය පිරිනමමි.

මෙම අධ්‍යයනය සංවිධානය කර වාර්තාව පිළියෙල කිරීමට කටයුතු කළ පුස්තකාල පර්යේෂණ අංශයට ස්තුතිය පුද කරන අතර, දත්ත පදනම නිර්මාණය, විශ්ලේෂණය හා පර්යේෂණ වාර්තාව සම්පාදනය කළ පර්යේෂණ නිලධාරි උදිත ගුණසේකර මහතාට ස්තුතිවන්ත වෙමි.

දත්ත විශ්ලේෂණය සහ වාර්තාව පරීක්ෂා කිරීම් කටයුතු සිදු කිරීම හා විශේෂඥ උපදෙස් ලබාදුන් කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන, මහාචාර්ය ඩබ්ලිව්. එන්. වික්‍රමසිංහ මහතාට හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඒ. ඒ. සුනේත්‍රා මහත්මියට ද ස්තුතිය පුද කර සිටිමි.

මීට අමතරව පුස්තකාල පර්යේෂණ අංශයේ උපදේශක කමිටුව නියෝජනය කළ සියලුම සාමාජික මහත්ම මහත්මීන්ට ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් මහතාට, හිටපු අධ්‍යක්ෂ ආචාර්ය ජී. ඩී. අමරසිරි මහතාට, අධ්‍යක්ෂ පද්මා බණ්ඩාරනායක මහත්මියට හා පුස්තකාල පර්යේෂණ අංශයේ අංශ ප්‍රධාන මෛත්‍රී ජයසුන්දර මහතාට, හිටපු අංශ ප්‍රධාන කමලාංගනී සුබසිංහ මහත්මියට සහ නන් අයුරින් සහාය වූ සියලු දෙනාට ස්තුතිය පුද කර සිටිමි.

**සොනාල ගුණවර්ධන**

සභාපති

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ ප්‍රවණතා පිළිබඳව නිරන්තරව අවධානය යොමු කිරීම හා ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පැවරෙන ප්‍රධාන වගකීමක් බව සඳහන් කළ යුතුය. වර්තමානයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සහ නව මාධ්‍ය ක්ෂේත්‍රවල පවතින ශීඝ්‍ර වර්ධනය පුස්තකාල කටයුතු කෙරෙහි ප්‍රබල ලෙස බලපාන අතර සාමාන්‍ය පාඨක හැසිරීම් කෙරෙහි ද මෙමගින් ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි. පාඨක හැසිරීම පිළිබඳව කාලීනව අධ්‍යයනය කිරීම හා ඒ පිළිබඳ විමසා බැලීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර ඒ මගින් පුස්තකාල ක්ෂේත්‍රයේ ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය තීරණ ගැනීමට බෙහෙවින් ඉවහල් වේ. පුස්තකාල භාවිත කරන පාඨක ප්‍රජාවගේ මෙන් ම රටක සාමාන්‍ය ප්‍රජාව අතර පොදුවේ ''කියවීම'' හා එහි ස්වභාවය පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වන අතර එය ඕනෑම රටක හෝ සමාජයක පුරවැසියන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය මැන බැලීමේ ප්‍රබල සාධකයක් වන බැවිනි.

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය යනු සමස්ත දිවයිනම ආවරණය වන පරිදි විසරී ස්ථානගත වී තිබෙන ආයතන පද්ධතියක් වන අතර ඒ මගින් මෙරට සමස්ත පාඨක ප්‍රජාවම ඒකරාශී කිරීම සඳහා සකසා තිබෙන විශේෂ ආයතන පද්ධතියක් ලෙසින් ද හඳුන්වා දිය හැකිය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කළ මෙම ජාතික සමීක්ෂණය සඳහා මහජන පුස්තකාල පද්ධතිය සම්බන්ධ කර ගැනීමේ මූලික අරමුණ වූයේ ද ඒ මගින් මෙරට සමස්ත පාඨක ප්‍රජාවම නියෝජනය කර ගැනීමේ අපේක්ෂාවෙන් බව ද සඳහන් කළ යුතුය.

මහජන පුස්තකාල පද්ධතිය තුළ ඉදිරි සැලසුම් සකස් කිරීමට මෙන්ම පුස්තකාල වෘත්තිකයන්ගේ ආකල්ප සංවර්ධනය උදෙසා මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල බෙහෙවින් ඉවහල්වනු ඇතැයි විශ්වාස කරන අතර පොතපත හා අනෙකුත් තොරතුරු මාධ්‍ය පරිහරණයේ දී පාඨකයින්ගේ රුචිකත්වයේ ස්වභාවය හඳුනාගැනීමට ද මෙම සමීක්ෂණය දායක වී තිබේ. සමීක්ෂණ වාර්තාව මගින් ඉදිරිපත් වී තිබෙන යෝජනා හා නිගමන කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කළ යුතු අතර කියවීම ප්‍රවර්ධනය හා සම්බන්ධ සැලසුම් සකස් කිරීමේ දී මෙම සමීක්ෂණය විශේෂ අවධානයට ලක් කළ හැකිය.

කෙසේ වූවද මෙම සමීක්ෂණය සාර්ථකව සිදු කොට ඒ මගින් නිරූපිත තොරතුරු ඇසුරින් මෙවැනි වාර්තාවක් සැකසීම ඉතා ප්‍රශංසනීය කටයුත්තක් වන අතර ඒ සඳහා සහාය දැක්වූ සියලු දෙනාට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කෘතඥතාවය හිමි වේ.

**ඩබ්ලිව්. සුනිල්**
අධ්‍යක්ෂ ජනරාල්

# පටුන


පෙරවදන v

හැඳින්වීම vii

පටුන xi-xi

වගු නාමාවලිය xii

ප්‍රස්තාර නාමාවලිය xiii

රූප සටහන් නාමාවලිය xiii

**පළමු පරිච්ඡේදය - හැඳින්වීම** **1-10**

1.1 අධ්‍යයනයේ පසුබිම 1-3

1.2 පසුබිම් තොරතුරු 3-6

1.2.1 කියවීම 3

1.2.2 කියවීමේ රුචිකත්වය 4

1.2.3 කියවීමේ පුරුදු කෙරෙහි බලපාන සාධක 5

1.2.4 මහජන පුස්තකාල 6

1.3 පර්යේෂණ අරමුණු 7

1.3.1 පාඨක ප්‍රජාවගේ කියවීමට අදාළව සමීක්ෂණය මගින් අනාවරණය කර ගැනීමට අපේක්ෂිත කරුණු 7

1.4 අධ්‍යයනයේ වැදගත්කම සහ පර්යේෂණ ගැටලුව 8

1.5 සමීක්ෂණ සැලැස්ම 8

1.6 නියැදිය 9

1.7 දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය 10

**දෙවන පරිච්ඡේදය - දත්ත විශ්ලේෂණය** **11-51**

2.1 පාඨකයන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු 11-17

2.1.1 ස්ත්‍රී / පුරුෂ භාවය 11

2.1.2 පාඨකයන්ගේ ව්‍යාප්තිය - ආගම අනුව 12

2.1.3 පාඨකයන්ගේ ව්‍යාප්තිය - ජන වර්ගය අනුව 13

2.1.4 වයස් කාණ්ඩ අනුව පාඨකයන්ගේ ව්‍යාප්තිය 14-15

2.1.5 පාඨකයන්ගේ අධ්‍යාපන තත්ත්වය 15

2.1.6 පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු සම්බන්ධ තොරතුරු 16-17

2.1.7 රැකියාව/ආර්ථික කටයුත්තෙහි ස්වභාවය 17

2.2 කියවීමේ ද්‍රව්‍ය හා පුරුදු 18-35

2.2.1 කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍ය 18-19
2.2.2 විවිධ මාධ්‍යයන් පරිශීලනය කිරීම 19-28
2.2.2.1 මුද්‍රිත මාධ්‍ය භාවිතය 19-20
2.2.2.2 මුද්‍රිත මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය 21-22
2.2.2.3 ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය 22
2.2.2.4 විද්‍යුත් මාධ්‍ය භාවිතය 23-24
2.2.2.5 විද්‍යුත් මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය 24-25
2.2.2.6 සමාජ මාධ්‍යය භාවිතය 25-26
2.2.2.7 සමාජ මාධ්‍යය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය 26-27
2.2.2.8 වෙනත් මාධ්‍යය භාවිතය 28

2.2.3 කියවීම් ද්‍රව්‍ය භාවිතය 28-29

2.2.4 කියවීම සඳහා අන්තර්ජාල වෙබ් පිටු භාවිතය 29-30
2.2.5 කියවීම සඳහා ගත කරනු ලබන කාලය 30-31

2.2.5.1 කියවීම සඳහා දිනකට ගත කරනු ලබන කාලය 30-31
2.2.5.2 කියවීම සඳහා සතියකට ගත කරනු ලබන දින ප්‍රමාණය 31

2.2.6 කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී පාඨකයන් විසින් සැලකිලිමත් වන කරුණු 32-33
2.2.7 මහජන පුස්තකාල භාවිත කිරීමේ අරමුණු 34
2.2.8 පුස්තකාලයෙන් අවශ්‍ය පොත්පත් තෝරා ගැනීමට භාවිත කරන ක්‍රම 35

2.3 කියවීම පිළිබඳ ආකල්ප 36-41
2.3.1 පොත් කියවීමේ අරමුණු 36
2.3.2 කියවීම පිළිබඳව පාඨකයන් විසින් දරනු ලබන විවිධ මත/අදහස් 37
2.3.3 දේශීය හා විදේශීය කර්තෘවරු 37-39
2.3.4 කියවීමට වඩාත් කැමති පොත් 39-41

2.4 කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම 41-46

2.4.1 කියවීම් ද්‍රව්‍ය ලබා ගන්නා ක්‍රම 41-42
2.4.2 පාඨකයන් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් පසුගිය මාස 06 තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීම 42-43
2.4.3 කියවීම් ද්‍රව්‍ය මිල දී නොගැනීමට මුල් වූ හේතූන් 43-44
2.4.4 පසුගිය මාස 6ක කාලසීමාව තුළ මිල දී ගත් කියවීම් ද්‍රව්‍ය 4-45
2.4.5 මහජන පුස්තකාලයට අමතරව භාවිත කරනු ලබන වෙනත් පුස්තකාල වර්ග 45-46

2.5 කියවන පරිසරය හා බාධක 46-50

2.5.1 නිවෙස්වල පොත් එකතුවක් පවත්වාගෙන යාම 46-47

2.5.2 කියවීමට වඩාත් කැමති ස්ථාන 47-48
2.5.3 කියවීමේ රුචිකත්වය පිළිබඳ පාඨක අදහස් 48-49
2.5.4 පොත්පත් කියවීමේදී පාඨකයන් හට පවතින විවිධ බාධක 49-50

2.6 අදහස් 50-51

**තෙවන පරිච්ඡේදය - සාරාංශය** **53-58**

3.1 පසුබිම් තොරතුරු 53-54
3.2 කියවීම් ද්‍රව්‍ය හා කියවීමේ පුරුදු 54-55
3.3 කියවීම පිළිබඳ ආකල්ප 56
3.4 කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම 56-57
3.5 කියවන පරිසරය හා බාධක 57-58

**සිව්වන පරිච්ඡේදය - නිර්දේශ** **59-61**

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 62-63

ඇමුණුම් 01 - සමීක්ෂණයට අදාළ ප්‍රශ්නාවලිය

ඇමුණුම් 02 - ප්‍රතිචාර ලබා දුන් මහජන පුස්තකාල නාමාවලිය - දිස්ත්‍රික්ක හා පළාත් පාලන ආයතන අනුව

වගු නාමාවලිය


| | | |
|---|---|---|
| වගු අංක 01 | : | පළාත්/දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතනවලින් තෝරා ගත් පාඨක නියැදිය |
| වගු අංක 02 | : | පාඨකයින්ගේ ව්‍යාප්තිය - ස්ත්‍රී/පුරුෂ භාවය අනුව |
| වගු අංක 03 | : | ස්ත්‍රී/පුරුෂ භාවය තුළ පළාත් පාලන ආයතනයන්ගේ නියෝජනය |
| වගු අංක 04 | : | පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු සම්බන්ධ තොරතුරු |
| වගු අංක 05 | : | පළාත් පාලන ආයතන මට්ටමින් කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍යය |
| වගු අංක 06 | : | කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණු |
| වගු අංක 07 | : | දේශීය හා විදේශීය කතුවරුන් |
| වගු අංක 08 | : | කියවීමට වඩාත් කැමති පොත් |

ප්‍රස්තාර නාමාවලිය


ප්‍රස්තාර අංක 01 : ස්ත්‍රී/පුරුෂ භාවය අනුව පාඨකයින්ගේ ව්‍යාප්තිය
ප්‍රස්තාර අංක 02 : පාඨකයන්ගේ ව්‍යාප්තිය - ආගම අනුව
ප්‍රස්තාර අංක 03 : පාඨකයන්ගේ ව්‍යාප්තිය - ජන වර්ගය අනුව
ප්‍රස්තාර අංක 04 : වයස් කාණ්ඩ අනුව පාඨකයන්ගේ ව්‍යාප්තිය
ප්‍රස්තාර අංක 05 : ප්‍රතිචාරිකයන්ගේ අධ්‍යාපන තත්වය
ප්‍රස්තාර අංක 06 : පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු සම්බන්ධ තොරතුරු
ප්‍රස්තාර අංක 07 : පාඨකයන් දැනට නියුක්තව ඇති රැකියාව/ආර්ථික කටයුත්තෙහි ස්වභාවය
ප්‍රස්තාර අංක 08 : පාඨකයන් විසින් කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍ය/මාධ්‍යයන්
ප්‍රස්තාර අංක 09 : මුද්‍රිත මාධ්‍ය භාවිතය
ප්‍රස්තාර අංක 10 : ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය
ප්‍රස්තාර අංක 11 : විද්‍යුත් මාධ්‍ය භාවිතය
ප්‍රස්තාර අංක 12 : සමාජ මාධ්‍ය භාවිතය
ප්‍රස්තාර අංක 13 : විවිධ කියවීම් ද්‍රව්‍ය භාවිතය
ප්‍රස්තාර අංක 14 : කියවීම සඳහා අන්තර්ජාල වෙබ් පිටු භාවිතය
ප්‍රස්තාර අංක 15 : කියවීම සඳහා දිනකට වැය කරනු ලබන පැය ගණන
ප්‍රස්තාර අංක 16 : කියවීම සඳහා සතියකට ගත කරනු ලබන දින ප්‍රමාණය
ප්‍රස්තාර අංක 17 : කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණු, ප්‍රමුඛතා මට්ටම අනුව
ප්‍රස්තාර අංක 18 : පුස්තකාල භාවිත කිරීමේ අරමුණු
ප්‍රස්තාර අංක 19 : පොත්පත් තෝරා ගැනීම සඳහා භාවිත කරනු ලබන විවිධ ක්‍රම
ප්‍රස්තාර අංක 20 : පොත් කියවීමේ අරමුණු
ප්‍රස්තාර අංක 21 : කියවීම පිළිබඳව පාඨකයන් විසින් දරන විවිධ මත/අදහස්
ප්‍රස්තාර අංක 22 : කියවීම පිළිබඳව පාඨකයන් විසින් දරන විවිධ මත/අදහස
ප්‍රස්තාර අංක 23 : ප්‍රතිචාරිකයින් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් පසුගිය මාස 06 තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීම
ප්‍රස්තාර අංක 24 : පසුගිය මාස 06ක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී නොගැනීමට හේතු
ප්‍රස්තාර අංක 25 : ප්‍රතිචාරිකයින් විසින් පසුගිය මාස 06ක කාලසීමාව තුළ මිල දී ගත් කියවීම් ද්‍රව්‍ය
ප්‍රස්තාර අංක 26 : මහජන පුස්තකාලයට අමතරව භාවිත කරනු ලබන වෙනත් පුස්තකාල වර්ග
ප්‍රස්තාර අංක 27 : නිවෙස් තුළ පොත් එකතුවක් පවත්වාගෙන යාම
ප්‍රස්තාර අංක 28 : කියවීමට වඩාත් කැමති ස්ථාන
ප්‍රස්තාර අංක 29 : කියවීමේ රුචිකත්වය පිළිබඳ පාඨක අදහස්
ප්‍රස්තාර අංක 30 : පොත්පත් කියවීමේ දී පාඨකයන් හට පවතින විවිධ බාධක
ප්‍රස්තාර අංක 31 : අදහස් පිළිබඳ ප්‍රතිචාරිකයන්ගේ මතය


රූප සටහන් නාමාවලිය


රූප සටහන 01 : මුද්‍රිත මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය
රූප සටහන 02 : විද්‍යුත් මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය
රූප සටහන 03 : සමාජ මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 අධ්‍යයනයේ පසුබිම

වත්මන් සමාජය දැනුම පාදක කරගත් සමාජයක් (Knowledge Based Society) වශයෙන් හඳුන්වනු ලබයි. පැරණි සමාජය තුළ පුද්ගලයින්ගේ කාර්යභාරය ඉතා සරල වූ අතර, වර්තමානය වනවිට පුද්ගල අවශ්‍යතා අසීමිත වන අතර ජීවන පැවැත්ම අරභයා විශාල ආයාසයක් දැරීමට සිදුව තිබේ. ඒ අනුව සමාජය තුළ පුද්ගලයා විසින් තම පැවැත්ම තහවුරු කර ගැනීමේ දී පුද්ගලයා තුළ පවතින දැනුම ප්‍රධාන සාධකයක් බවට පත්ව තිබේ. ඒ තුළින් පුද්ගලයා හා සමාජය අතර පවතින සම්බන්ධතාවය හා එය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට ඇති හැකියාව වර්ධනය වේ. දැනුම ලබා ගැනීමේ හා වර්ධනය කර ගැනීමේ මාර්ග කිහිපයක් පවතී. කියවීම, සවන්දීම, නිරීක්ෂණය, විවේචනාත්මක චින්තනය හා විවිධ මාධ්‍ය මෙම මාර්ග වේ. නවීන සන්නිවේදන මාධ්‍ය කොතරම් දියුණු වුව ද, දැනුම ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් මුද්‍රිත මාධ්‍ය ඇසුරෙන් කියවීම තවමත් මූලික ස්ථානයක් ලබාගෙන තිබේ. කියවීම පවතින සමාජයක පැවැත්ම රටක සමාජ සංවර්ධනයේ වැදගත් දර්ශකයක් ලෙස හඳුනා ගත හැකිය. විශේෂයෙන් රටක මානව සංවර්ධන මට්ටම පිළිබඳ අවබෝධ කර ගැනීමේ දී අධ්‍යාපනය හා ඒ ආශ්‍රිත නිර්ණායකයන් මානව සංවර්ධන මිනුමක් ලෙස භාවිත කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් මානව සංවර්ධන දර්ශකය (Human Development Index -HDI) අධ්‍යාපන මට්ටම පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා "සාක්ෂරතාව" යන සංරචකය භාවිතයට ගනී. මූලිකවම සාක්ෂරතාව හරහා පුද්ගලයෙකුට කියවීමට හා ලිවීමට ඇති හැකියාව පිළිබඳ ගණනය කරනු ලබයි. සාක්ෂරතාව පුද්ගලයන්ගේ ආර්ථික, මානසික, සමාජයීය සහ ශාරීරික යහපැවැත්ම දියුණු කරනු ලබයි. ඒ සඳහා මූලිකව සාක්ෂරතාව පදනම් කර ගත් කියවීමට ඇති හැකියාව වැඩි දියුණු කරගැනීම බලපානු ලබයි. වර්තමානය වනවිට සාම්ප්‍රදායික කියවීම යන අර්ථ දැක්වීමට සීමා නොවී, පරිගණක සාක්ෂරතාව, මූල්‍ය සාක්ෂරතාව, සංස්කෘතික සාක්ෂරතාව, මාධ්‍යය සාක්ෂරතාව, දෘශ්‍ය සාක්ෂරතාව සහ ඩිජිටල් සාක්ෂරතාව වැනි වෙනස් පැතිකඩ රාශියකින් සාක්ෂරතාව පිළිබඳ අර්ථ ගැන්වෙයි. ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය - 2012 වාර්තාවට අනුව වයස අවු. 10 වඩා වැඩි පුද්ගලයින්ගේ සාක්ෂරතාව 95.7%ක මට්ටමක පවතින බව හඳුනාගෙන තිබේ. එමෙන්ම සාක්ෂරතා අනුපාතය පුරුෂයන් සඳහා 96.9% ක් වන අතර ස්ත්‍රීන් සඳහා 94.6% ක් වේ. ඒ අනුව සාක්ෂරතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ රටවල් අතරින් ප්‍රමුඛස්ථානයක් ලබා ගෙන ඇත. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තම සාමාජික රටවල් විසින් දිළිඳුකම පිටු දැකීම, පෘථිවි තලය රැක ගැනීම සහ සැමට සෞභාග්‍ය උදාකරදීම මූලික කර ගනිමින් තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) 17ක් මෙන්ම ඒ සඳහා පදනම් වූ ඉලක්ක 169 ක් සහ නිර්ණායක 244 ක් ද 2015 වර්ෂයේ දී හඳුන්වාදෙන ලදී. මෙම තිරසර සංවර්ධන අරමුණු හරහා ද පුද්ගලයාගේ කියවීමට ඇති අයිතිය තහවුරු කර තිබෙන අතර සංවර්ධනයේ නව මානයන් වෙත යොමු කිරීම ද සිදු කරනු ලබයි (United Nations, 2015).

තිරසර සංවර්ධන අරමුණු 17 අතරින් 04 වන අරමුණ ලෙස පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම (Ensure inclusive and equitable quality and promote lifelong learning opportunities for all) 2030 වන විට අධ්‍යාපනයේ සංවර්ධන මානයන් ලෙස දක්වා තිබේ. ස්ත්‍රී පුරුෂ භාවය අනුව, ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ සහ පහළ ද්විතියික මට්ටම්වල ඉගෙනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර කියවීමට සහ ගණිතමය කුසලතාවය සඳහා වන අවම මට්ටම පවතින අයගේ ප්‍රමාණය ඉහත සඳහන් කළ අධ්‍යාපන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී ඉවහල් වන බව පෙන්වා දී තිබේ. එමෙන්ම 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි ආකාරයෙන් කියවීම යන සංකල්පයට මූලික ස්ථානයක් ලබා දී තිබෙන අතර, එය විශ්වීය නිර්ණායකයන් බවට ද පත්ව තිබේ. ඒ තුළින් කියවීම කෙරෙහි දක්වන සුවිශේෂීභාවය අවබෝධ කර ගත හැකිය. එමෙන්ම 2030 වන විට සියලුම වයස් කාණ්ඩයන් නියෝජනය කරන පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු කියවීමේ හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම කෙරෙහි ද මෙම තිරසර සංවර්ධනය ඉලක්ක හරහා අවධානය යොමු කර තිබෙන අතර ඒ සඳහා ස්ත්‍රී පුරුෂ භාවය අනුව කිසියම් වයස් කාණ්ඩයකට අදාළව අවම සාක්ෂරතා කුසලතා අත්කරගෙන සිටීම මූලික නිර්ණායකයන් ලෙස දක්වා තිබේ.

මහජන පුස්තකාල ආශ්‍රිත කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය හරහා ශ්‍රී ලාංකික පාඨකයන්ගේ කියවීමේ පුරුද්ද හා ඒ පිළිබඳව වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාව විවිධ පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා) ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම මෙම මහජන පුස්තකාල ආශ්‍රිතව විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි සම්බන්ධ වූ පාඨක ප්‍රජාවක් පවතී. තවද මහජන පුස්තකාලයක ප්‍රමුඛතම අරමුණ වන්නේද තම සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගනිමින් පාඨක ප්‍රජාවට අවශ්‍ය සේවය සලසා දීමයි. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය පරිශීලනය කරන පාඨක ප්‍රජාවගේ කියවීමේ රුචිය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම සමීක්ෂණයේ මූලික අරමුණ වේ. ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව පවතින සම්පත් අනුව, පාඨක ප්‍රජාවගේ ස්වභාවය වැනි සාධක ඔස්සේ කියවීමේ පුරුද්ද කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳව ද මෙම සමීක්ෂණය ඔස්සේ අධ්‍යයනය කරන ලදී.

1964-1965 වර්ෂවල දී නන්දා නාරංගොඩ විසින් අතිරේක කියවීම සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේ. එම පර්යේෂණය පාසල් පුස්තකාලවල ගැටලු, පොත් නිෂ්පාදනයේ දුර්වලතා, කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේ. එමෙන්ම 1997-1998 වර්ෂවල දී නන්දා නාරංගොඩ විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසැල් දරුවන්ගේ කියවීමේ පුරුද්ද හා තොරතුරු හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් සමීක්ෂණයක් ක්‍රියාත්මක කර තිබේ. එම සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාථමික පාසල් කාණ්ඩ තුනක් යටතේ දරුවන්ගේ කියවීමට ඇති කැමැත්ත සහ කියවීම කෙරෙහි ගුරුවරුන්ගේ ආකල්ප පිළිබඳ විමසා තිබේ.

පසු කාලීනව මහාචාර්ය එස්. ටී. හෙට්ටිගේ මහතාගේ අධීක්ෂණය යටතේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් ශ්‍රී ලාංකික ප්‍රජාවගේ කියවීමේ රුචිකත්වය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේ. මෙම සමීක්ෂණය 1997-1998 වසරවල සිදු කළ අතර පැවති යුධමය වාතාවරණය හේතුවෙන් ශ්‍රී ලංකාවේ උතුර හා නැගෙනහිර පළාත් සම්බන්ධ කර නොගන්නා ලදී. ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ කියවීම සම්බන්ධයෙන් මෑත කාලීනව සිදු කරන ලද ප්‍රශස්ත මට්ටමේ සමීක්ෂණයක් ලෙස මෙම සමීක්ෂණය පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ පාසැල් ළමුන්ගේ කියවීමේ රුචිකත්වය සම්බන්ධයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2014 සහ 2017 වසරවල සමීක්ෂණ දෙකක් සිදු කර තිබේ. පළමු සමීක්ෂණය සඳහා උතුරු හා

නැගෙනහිර පළාත් හැර සෙසු පළාත් නියෝජනය වූ අතර දෙවන සමීක්ෂණයට උතුරු සහ නැගෙනහිර පළාත්වල පාසැල් දරුවන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කර තිබේ. මෙම සමීක්ෂණ දෙක මගින් පාසැල් දරුවන්ගේ කියවීමේ රුචිකත්වය පිළිබඳ බොහෝ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි වූ අතර මෑත කාලීනව මෙරට පාසැල් දරුවන් ඉලක්ක කර ගත් ජාතික මට්ටමේ සමීක්ෂණයක් ලෙස ද මෙය හඳුන්වා දිය හැකිය.

ඒ අනුව 2018 වර්ෂයේදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ආරම්භ කළ මෙම මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය හරහා මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ පුරුද්ද පිළිබඳව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. මීට පෙර පවත්වන ලද පාඨක සමීක්ෂණ හා සසඳා බැලීමේදී මෙම සමීක්ෂණයේ විශේෂත්වය වන්නේ ශ්‍රී ලංකාවේ යුධමය වාතාවරණය අවසන්වීමෙන් පසු සියලු පළාත් නියෝජනය වන පරිදි මහජන පුස්තකාල ආශ්‍රයෙන් පවත්වන ලද පළමු පාඨක සමීක්ෂණය වීමයි.

සමීක්ෂණ හා අධ්‍යයන කෙතෙක් සිදු වුවද මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිකත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි අධ්‍යනයක් මෑත කාලීනව සිදු නොවූ නිසා මෙම අධ්‍යයනය ඒ අතරින් විශේෂ වන බව සඳහන් කළ හැකිය. විශේෂයෙන්ම මෙම සමීක්ෂණය ඔස්සේ වර්තමානය වන විට මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින්ගේ අවශ්‍යතා සහ රසාස්වාදය පිළිබඳවත්, විවිධ සාමාජීය, ආර්ථික, අධ්‍යාපනික හා භූගෝලීය ව්‍යාප්තිය පදනම් කර ගනිමින් ජනතාව කියවීම සිදු කරන ආකාරය සහ ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීම හා එමගින් එළැඹෙන නිගමන හරහා ප්‍රත්පත්ති සම්පාදකයින්ට හා අනෙකුත් ඇල්මැති පාර්ශවයන් හට තීරණ ගැනීමට මෙම පර්යේෂණයේ නිගමන හා නිර්දේශ ඉවහල් වනු ඇත.

## 1.2 පසුබිම් තොරතුරු

### 1.2.1 කියවීම

කියවීම, ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වන අතර එය කාලානුරූපීව වර්ධනය වූ පසු කියවීමේ පුරුද්දක් (Reading Habit) බවට පත් වේ. ඉග්වේ (2011), සඳහන් කරන ආකාරයට ඉගෙනීමේ මූලික අංගයන්ගෙන් එකක් ලෙස කියවීම හඳුනා ගත හැකි අතර සාර්ථක කියවන්නෙකු පාසල් අවධියේ හෝ ඉන් ඔබ්බට වන්නට ඊට අනුවර්තනය වී සාර්ථක කියවන්නෙකු බවට පත්වේ. කියවීම වෙනුවෙන් වූ අර්ථ දැක්වීම කාලානුරූපීව වෙනස්කම්වලට භාජනය වී ඇත. අතීතයේදී කියවීම යන්න සරලව කිසියම් ක්ෂේත්‍රයක් හෝ පද්ධතියක් ආශ්‍රයෙන් දෘශ්‍ය තොරතුරු ලබා ගැනීම පිළිබඳව අදහස් කෙරේ. විසි වන සියවසේ දී කියවීම යන්න වඩාත් සංකීර්ණ වූ අතර ලිඛිත සලකුණු හා සංඥා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමක් ලෙස සලකන ලදී. ටොයිට් (2001), පෙන්වා දෙන පරිදි කියවීම යනු ලිඛිත වචනවල අන්තර්ගත සංකල්ප නැවත සිහිපත් කරනු ලබන සහ සිතීමේ එක්තරා ක්‍රියාවලියක් වේ. Reading is a process of thinking, recalling and relating concepts under the functioning of written words (Toit, 2001, p. 01). චෙට්‍රි සහ රූට් (2013), පෙන්වාදෙන ආකාරයට කියවීම තමා පිළිබඳව, අනෙක් මිනිසුන් හා ලෝකය පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට, මෙන්ම තම දැනුමේ සීමාවන් පුළුල් කිරීමට හා හඳුනා ගැනීම කෙරෙහි වැදගත් වන බව පෙන්වා දෙයි. Reading provides experience through which the individual may expand his horizons of knowledge, identity, extend and intensify his interest and gains deeper understanding of himself, of other human beings and of the world (Chetri & Rout, 2013, p. 01).

දනුස්කෝඩි (2011), පෙන්වා දෙන ආකාරයට අනෙක් සියලුම පුරුදු මෙන් පුද්ගලයෙකුගේ කියවීම වර්ධනය වන්නේ කාලයාගේ ඇවෑමෙන් වේ. Like all other habits, the habit of reading in an individual develops during the course of time (Thanuskodi, 2011, p. 01). කියවීම යන්න විවිධ දිශාවන් ඔස්සේ හඳුනා ගත හැකි වන අතර කියවීම විවිධ පුද්ගල අවශ්‍යතාවයන් මත පදනම් වී ඇත. වෘත්තීය කියවීම (Professional Reading), අධ්‍යාපනය සඳහා කියවීම (Reading for Education), විනෝදාස්වාදය සඳහා කියවීම (Reading for Entertainment) සහ සමාජ දැනුම සඳහා කියවීම (Reading for Social Knowledge) වශයෙන් වෙන් කර දැක්විය හැකි කියවීමට අදාළ කුසලතා (Reading Skills) කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ. කියවීමේ කුසලතා ලෙස ශබ්ද මාලාව, චතුර බව, මතකය, අවධානය යොමු කිරීම සහ පසුබිම් දැනුමක් පැවතීම යන කරුණු අවශ්‍ය බව හඳුනා ගත හැකිය.

### 1.2.2 කියවීමේ රුචිකත්වය

කියවීම, සංස්කෘතිකත්වය හා ආචාරධර්ම පද්ධතිය ප්‍රමුඛස්ථානයකට ගෙන එනු ලබන සහ පුද්ගලයෙකුගේ විශ්වීය දෘෂ්ටිය පුළුල් කරන ක්‍රියාකාරකමක් ලෙස හඳුනා ගෙන ඇති අතර, ආර්ථික හා සමාජ සුබසිද්ධිය සඳහා ඉවහල් වන දැනුම ලබා දීමෙහිලා ඉතා පුළුල් ලෙස උපයෝගී කර ගත හැකි ක්‍රියාමාර්ගයක් ලෙස හඳුනා ගත හැකි වේ. එමෙන්ම ඉහළ සාක්ෂරතාවයකින් යුත් සමාජයක අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉතා වැදගත් කාර්යභාර්යයක් හා සුවිශේෂී ස්ථානයක් කියවීම යන සාධකය මගින් සපුරනු ලබයි. නූතන සමාජ ක්‍රමය තුළ පොත්පත් පුද්ගලයන්ගේ ජීවිතයේ සුවිශේෂී කොටසක් බවට පත්ව ඇති අතර, එය නවතම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයේ සොයා ගැනීම නොතකා ඉදිරියට ගමන් කරමින් පවතී. වෙනස් වෙමින් පවතින ලෝකය තුළ නව දැනුම හා තාක්ෂණය විවිධාකාරයෙන් භාවිතයට ගනිමින් පවතින අතර, කියවීම ඔස්සේ ඒ සඳහා අනුවර්තනය වීමට ඇති හැකියාව තවදුරටත් වර්ධනය වේ. ස්වයං අධ්‍යයනය හා ජීවිත කාලය තුළ ඉගෙනීම යන කාර්යය තුළ කියවීම යනු ප්‍රමුඛතම කාර්යයක් බවට පත් වී ඇත.

කියවීම යන්න දීර්ඝ කාලයක් තුළ වරින් වර සිදු කිරීම හරහා එය කියවීමේ පුරුද්දක් බවට පත්වේ. වැග්නර් (2002), අනුව කියවීම සඳහා භාවිත කරනු ලබන මෙවලම්/උපකරණවල ප්‍රමාණය, කියවීම සඳහා ගත කරනු ලබන කාලයේ සාමාන්‍ය යන කරුණු කියවීමේ පුරුද්ද යන්න ගණනය කිරීමේදී සැලකිල්ලට ගන්නා බව දක්වා ඇත. In measurable terms reading habit is often considered in terms of the amount of materials being read the frequency receiving as well as the average time spent on reading, (Wagnar, 2002).

කියවීමේ උනන්දුව විවිධ අවශ්‍යතාවලින් පැන නගී. (ඇඩෙටෝරෝ, 2010) කියවීමේ උනන්දුව දක්වන සෑම අවස්ථාවකම විශේෂයෙන් පුද්ගලයෙකුගේ අවශ්‍යතා වෙත අවධානය යොමු විය හැකි බව සාකච්ඡා කරන ලදී. බොහෝ අවස්ථාවන්හී දී, කියවීමේ ක්‍රියාකාරකම්වල යෙදීමට ඇති උනන්දුව පුද්ගලයාගේ වටපිටාව සහ සන්දර්භය පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් පැන නගී. කියවීම මගින් මිනිසුන්ට තමන් අත්විඳින අත්දැකීම් පිළිබඳ තොරතුරු රැස් කිරීමට ඉඩ ලබා දේ. එබැවින් කියවීමෙන් පුද්ගලයන් ඕනෑම ආකාරයකින් ඔවුන් වටා ඇති වියවුල්සහගත බව සහ අපැහැදිලි බව අවම කිරීමට හැකි බවත් එමගින් විවිධ උත්තේජකවලට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට ඉඩ සලසන බව එම අධ්‍යයනය හරහා පෙන්වා දෙයි. Reading interest arises from different needs. It discussed that in all cases of reading interest, the attention may arise from the particular needs of an individual. In most cases, the interest to engage in the activity of reading arises from a need to gain information about the individual's surroundings and contexts. Reading allows people to gather information about the experiences they undergo. They acquire explanations for things that may confuse them. Hence, from reading,

individuals are able to minimize the confusion and the ambiguity that may surround them in any situation, thus allowing them to respond appropriately to various stimulations (Adetoro, 2010).

පුද්ගලයන්ගේ තර්කානුකූලව සිතීමේ හැකියාව වර්ධනය කර ගැනීමේ හා නිර්මාණශීලීත්වය ලබා ගැනීමට කියවීමේ පුරුද්ද භාවිතයක් ලෙස උපකල්පනය කළ හැකිය. එමෙන්ම පුද්ගලයින්ගේ මානසික හැකියාවන් හා පුද්ගල පෞරුෂත්වය වර්ධනය කිරීම සඳහා වැදගත් මෙවලමකි. එසේම කියවීම යනු සමාජ, ආර්ථික හා ප්‍රජා ජීවිතය හා පුද්ගලික, මානසික වර්ධනයන් සඳහා ප්‍රවේශයන් වේ. It can be assumed as a practice that assists individuals to gain creativeness and develop their critical thinking capacities. In this sense, reading habit is an important total for the development of personalities and mental capacities of individuals. In addition to personal and mental developments is an access to social, economic and civil life, (Clark & Rumbold, 2006).

පුද්ගලයෙකු සඳහා ප්‍රායෝගික කුසලතා ළඟා කර ගැනීමේ දී හා සෞඛ්‍ය සම්පන්න බුද්ධිමය වර්ධනයක් සඳහා හොඳ කියවීමේ පුරුද්දක් අවශ්‍ය වන අතර එය ඉතා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. තවදුරටත් මේ පිළිබඳව අධ්‍යයනය කරනවිට හඳුනාගත හැකි වන්නේ පුද්ගලයෙකුගේ අවශ්‍යතා තීරණය වන්නේ ඔහුගේ කියවීමේ කාර්යයේ තීව්‍රතාව හා එහි ප්‍රමාණය අනුව බවයි. උදාහරණයක් ලෙස පොතක් කියවන විට එක් අයෙකුගේ අදහස් තමන් විසින් ප්‍රතික්ෂේප කිරීමට හෝ භාර ගැනීමට පෙළඹෙන අතර සමාජය පිළිබඳව නිවැරදි චින්තනයකට එළඹීමට මග පාදා දෙයි.

### 1.2.3 කියවීමේ පුරුදු කෙරෙහි බලපාන සාධක

කියවීම සහ කියවීමේ පුරුදු සම්බන්ධව අධ්‍යයනය කරන විට කියවීම වෙනුවෙන් බලපානු ලබන සාධක සම්බන්ධයෙන් ද අධ්‍යයනය කිරීම වැදගත් වේ. කියවීම සඳහා විවිධ ආකාරයෙන් සමාජීය, අධ්‍යාපනික, ආර්ථිකයමය හා පාරිසරික සාධක රැසක් බලපානු ලබන බව විවිධ අධ්‍යයනයන් හරහා අනාවරණය වී තිබේ. විශේෂයෙන්ම කියවීම හෝ ඒ ආශ්‍රිත කියවීමේ පුරුදු පුද්ගලානුබද්ධව වෙනස් වේ. ඒ අනුව කියවීම හෝ ඒ ආශ්‍රිත කියවීමේ පුරුදු සඳහා බලපානු ලබන සාධක ඍජුව හෝ වක්‍රාකාරයෙන් බලපෑම් එල්ල කරනු ලබයි.

විශේෂයෙන්ම කියවීම හා ඒ ආශ්‍රිත කියවීමේ පුරුදු කෙරෙහි "පවුල සහ පවුලේ පසුබිම" තීරණාත්මක සාධකයක් ලෙස හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම කුඩා කාලයේ දරුවකුගේ කියවීම ආරම්භ වන්නේ තම පවුල ආශ්‍රයෙනි. එතුළින් ලැබෙන ආරම්භය පුද්ගලයෙකුගේ ජීවිතයේ අවසාන කාල පරිච්ඡේදය දක්වා බලපෑමක් එල්ල කරයි. දෙමාපියන්ගෙන් හා පවුලේ අනෙකුත් සාමාජිකයන්ගෙන් ලැබෙන සහයෝගය මත දරුවන් තම කියවීම ආරම්භ කරන අතර එය තවදුරටත් සංවර්ධනය කර ගැනීමට පෙළඹෙයි. උස්ටන්. (2007), වොට්සන්. (2004) සහ පෙලිග්‍රින්. (1985) පෙන්වා දෙන ආකාරයට තම දරුවන් පොත්පත් කෙරෙහි ධනාත්මක ආකල්පයන් වර්ධනය කර ගැනීමටත්, විශ්වාසයෙන් යුතුව පොත්පත් වෙත ළඟාවීමටත් ඔහුගේ/ඇයගේ පවුලේ සහාය විශාල දායකත්වයක් සපයයි. එමෙන්ම පාසල් දරුවන්ගේ සාක්ෂරතාව සඳහා දෙමව්පියන්ගේ පෙර අත්දැකීම් කියවීම හා කියවීමේ පුරුදු හා කුසලතා වර්ධනය උදෙසා ඉවහල්වන බව සඳහන් කරයි.

පවුල්වල ආදායම් තත්වය ද පුළුල් ලෙස මෙම තත්වය සඳහා උපයෝගී වේ. මීට පෙර ශ්‍රී ලංකාවේ සිදු කළ පාඨක සමීක්ෂණය (1997 - 1998) අනුව තහවුරු වූයේ පවුල්වල ආදායම් තත්වය, පවුල සතු මිලදී ගැනීමේ හැකියාව මත කියවීම හා කියවීම ආශ්‍රිත පුරුදු සඳහා බලපෑම් එල්ල කරන බවයි. එම සමීක්ෂණයට අනුව නාගරික අංශයෙහි පොත් කියවීමේ තත්වය 40.6%ක් වූ අතර ග්‍රාමීය අංශයෙහි 39.8%ක් විය. වතු අංශයෙහි එම සංඛ්‍යාව ඉතා අඩු තත්වයක් (28.3%) බව හඳුනා ගත හැකි විය. පුද්ගලයන්ගේ අධ්‍යාපන

මට්ටමද කියවීම හා ඒ ආශ්‍රිත පුරුදු කෙරෙහි සෘජුව හා වක්‍රව බලපානු ලබන සාධකයන් ලෙස පෙන්වා දිය හැක.

අධ්‍යාපන මට්ටම ඉහළ අගයක පවතින විට බොහෝ දුරට කියවීමේ කුසලතා වර්ධනය වන ස්වභාවයක් හඳුනා ගත හැකි අතර අධ්‍යාපන මට්ටම අඩු මට්ටමකට ළඟා වන විට එහි පසුගාමී තත්වයක් ද හඳුනා ගත හැකි වේ. එමෙන්ම ස්ත්‍රී පුරුෂභාවය සහ වයස් මට්ටම ද කියවීමේ පුරුදු කෙරෙහි බලපෑම් එල්ල කරනු ලබයි. ලෝග්. (2011) අනුව තම අධ්‍යයනය තුළින් කියවීමේ පුරුදු කෙරෙහි බලපෑම් එල්ල කරනු ලබන ප්‍රධානතම සාධක දෙකක් ලෙස ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස යන සාධක පෙන්වා දී තිබේ. ස්ටෙන්බර්ග්. (2001), රෝස්. (2005) සහ අබිරාමී. (2007) යන අධ්‍යයන හරහා පෙන්වා දෙනු ලබන්නේ පුරුෂ පාර්ශවයට වඩා ස්ත්‍රී පාර්ශවය කියවීම කෙරෙහි වැඩි වශයෙන් කැමැත්තක් දක්වන බවයි. තවද, තොරතුරු බෙදාහැරීමේ සහ ගබඩා කර තිබෙන ආකාරයද පුද්ගලයාගේ කියවීම කෙරෙහි බලපානු ලබයි.

සේති සහ පන්ඩා. (2012), පෙන්වා දෙන ආකාරයට OPAC, CD-ROM, ඔන්ලයින් දත්ත පද්ධති, විද්‍යුත් සඟරා, විද්‍යුත් පොත්, අන්තර්ජාල සම්පත්, ඊ-මේල්, යනාදී වශයෙන් තොරතුරු විද්‍යුත් ආකාරයෙන් ගබඩා කර තැබීම හා භාවිතය කෙරෙහි වැඩි රුචිකත්වයක් දක්වයි. පාඨකයන් මුද්‍රිත මාධ්‍ය භාවිතය කෙරෙහි වැඩි කැමැත්තක් නොපෙන්වන බවද මෙම අධ්‍යයන තුළින් අනාවරණය වේ.

### 1.2.4 මහජන පුස්තකාල

සමාජයීය හා පුද්ගලානුබද්ධව නිදහස, සෞභාග්‍ය සහ සංවර්ධනය මූලික මිනිස් වටිනාකමක් ලෙස හඳුනා ගත හැකිය. ඵලදායි සහභාගීත්වය හා ප්‍රජාතන්ත්‍රවාදයේ සංවර්ධනය රඳා පවතින්නේ සතුටුදායක මට්ටමක පවතින අධ්‍යාපනය මෙන්ම නිදහස් හා අසීමිතව දැනුම, චින්තනය, සංස්කෘතිය පදනම්ව තොරතුරුවලට ප්‍රවේශ වීමට ඇති හැකියාව මතය. පුද්ගල මට්ටමින් හා සමාජ කණ්ඩායම් වශයෙන් සංස්කෘතිමය සංවර්ධනය, ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව, ජීවිත කාලය පුරා ඉගෙනීම සඳහා වන මූලික අවස්ථාවන් සැපයීම මෙන්ම දැනුම සඳහා දේශීය වශයෙන් වන මාවතක් ලෙස මහජන පුස්තකාල හඳුනා ගත හැකිය.

වර්තමාන ලෝකයේ දියුණුවට හේතු වූ ආයතන අතුරින් පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එම ආයතන අතුරින් ද පොදු මහජනතාවට සමීපව කටයුතු කරමින් තොරතුරු සේවා සැපයීමට ඉදිරිපත්ව සිටින්නේ මහජන පුස්තකාල පද්ධතියයි. ප්‍රාදේශීයව තොරතුරු සැපයීමේ වගකීම ද ඊට පැවරී ඇති අතර මහජන පුස්තකාල සෑම රටකම නාගරික, ප්‍රාදේශීය භේදයකින් තොරව ක්‍රියාත්මක වේ.

මහජන පුස්තකාලය යනු ප්‍රාදේශීය මට්ටමින් දැනුම සඳහා වන මාර්ගයයි. එය ඒ ඒ පුද්ගලයන් හා සමාජ කණ්ඩායම් වල යාවජීව ඉගෙනුම, ස්වාධීනව තීරණ ගැනීම, සංස්කෘතික සංවර්ධනයට අවශ්‍ය මූලික තත්වයන් සම්පාදනය කරයි, (IFLA /UNESCO Public Library Manifesto, 1994).

"The public library, the local gateway to knowledge, provides a basic condition for lifelong learning, independent decision- making and cultural development of the individual and social groups”, (IFLA /UNESCO Public Library Manifesto, 1994). මෙම නිර්වචනය හරහා තවදුරටත් පැහැදිලි වන්නේ මහජන පුස්තකාලයක් යනු කිසියම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් කේන්ද්‍ර කොටගෙන මහජන සේවය සඳහා ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර එකී ප්‍රදේශයේ/ස්ථානයේ වෙසෙන ජනතාවගේ අධ්‍යාපනික, ආර්ථික, සාමාජයීය, සංස්කෘතික සංවර්ධනයට අදාළ දැනුම් අවශ්‍යතා සපුරාලමින් පුද්ගල පෞරුෂ සංවර්ධනය,

සමාජශීලීත්වය, සෞන්දර්යාත්මක කුසලතා සාක්ෂාත් කරන සියලුම ජන කොටස්වලට ජාතිය, ආගම් හෝ ස්ත්‍රී, පුරුෂ හෝ වයස ආදී භේදවලින් තොරව සේවා සපයන පොදු ආයතනයක් බවයි.

## 1.3 පර්යේෂණ අරමුණු

- ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිකත්වය පිළිබඳ වත්මන් තත්වය අවබෝධ කර ගැනීම.
- කියවීම, කියවීමේ රුචිකත්වය, කියවීම සඳහා බලපානු ලබන සාධක හා බාධාවන් පිළිබඳ හඳුනා ගැනීම.
- පොත්පත් කියවීම හා කියවීමේ රුචිකත්වය සම්බන්ධයෙන් අධ්‍යාපනඥයින්ට, පුස්තකාලයාධිපතීන් හා සාමාන්‍ය ජනතාව වෙත අවශ්‍ය පසුබිම් දත්ත ලබා දීම.
- මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ පුරුදු සහ මට්ටම් නිගමනය කිරීම හා ඒවාට හේතු සාධක වූ කරුණු නිශ්චය කර ගැනීම.
- කියවීමේ රුචිය වර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමේදී අවශ්‍ය වන තොරතුරු ලබා දීම.
- කියවීම ප්‍රවර්ධනය සඳහා වන නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

### 1.3.1 පාඨක ප්‍රජාවගේ කියවීමට අදාළව සමීක්ෂණය මගින් අනාවරණය කර ගැනීමට අපේක්ෂිත කරුණු

- පාඨකයින්ගේ ප්‍රජා විද්‍යාත්මක හා සමාජයීය පසුබිම
- පරිශීලනය කරන තොරතුරු මාධ්‍ය/මාධ්‍යයන් (මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය, විද්‍යුත් ආදී වශයෙන්)
- පරිගණක ආශ්‍රිත තොරතුරු ලබා ගැනීමේදී භාවිත කරන විවිධ මෙවලම්
- කියවීම සඳහා වැය කරන කාලය
- කියවීම සඳහා තොරතුරු මූලාශ්‍ර තෝරා ගැනීමේ දී සැලකිලිමත් වන කරුණු
- පුස්තකාල භාවිත කිරීමේ පරමාර්ථ
- පුස්තකාලවලින් පොත්පත් තෝරා ගැනීමේ දී යොදා ගන්නා ක්‍රමෝපායන්
- කියවීමේ අරමුණු හා ආකල්ප
- පාඨකයින් කැමැත්තක් දක්වන දේශීය හා විදේශීය කර්තෘවරු
- පාඨකයින් කැමැත්තක් දක්වන පොත් පිළිබඳ තොරතුරු
- කියවීම සඳහා පවතින සමාජ ආර්ථික හා වෙනත් බාධක
- කියවීමට කැමති ස්ථාන පිළිබඳ තොරතුරු
- කියවීමේ රුචිය වර්ධනය කෙරෙහි බලපාන සාධක

## 1.4 අධ්‍යයනයේ වැදගත්කම සහ පර්යේෂණ ගැටලුව

අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ප්‍රමුඛතම හා අත්‍යාවශ්‍යම අංශයක් ලෙස "කියවීම" හඳුනා ගත හැකිය. රටක සමාජීය වශයෙන් සංවර්ධනය මැන බැලීමේ දී ද සාක්ෂරතාවය හරහා කියවීමේ ඇති වැදගත්කම පෙන්වා දෙනු ලබයි. රටක අනාගත සැලසුම් සකස්කිරීමේ දී විශේෂයෙන්ම ප්‍රතිපත්ති සැලසුම්කරුවන් හට කියවීම, කියවීම් ආශ්‍රිත පුරුදු , කියවීමේ වර්තමාන ස්වභාවය, කියවීම සඳහා බලපානු ලබන සාධක සහ කියවීමේ දී ඇතිවන ගැටලු ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් කියවීම,

කියවීමේ පුරුදු රටක ජනතාව තුළ පවතින ආකාරය මැන බැලීමට සමීක්ෂණ පැවැත්වීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය හා ඒ ආශ්‍රිත සේවාවන් සම්බන්ධයෙන් ප්‍රමුඛව කටයුතු කරන ආයතනය වන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි පුස්තකාල පද්ධතියක් ස්ථාපිත වී තිබේ. එම පුස්තකාල පද්ධතිය තුළ සාමාන්‍ය මහජනතාව සමග සම්බන්ධතාවක් දක්වන ප්‍රධාන පුස්තකාල පද්ධතිය ලෙස මහජන පුස්තකාල පද්ධතිය හඳුනා ගත හැකිය. ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන අනුව මුළු දිවයින පුරා ක්‍රියාත්මක වන මහජන පුස්තකාල ප්‍රමාණය 1,200කි. පළාත් පාලන ආයතන යටතට ගැනෙන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨකයින් සැලකිය යුතු ප්‍රමාණයක් විවිධ වූ තොරතුරු අවශ්‍යතාවන් තෘප්තිමත් කර ගැනීම පිණිස භාවිත කරනු ලැබේ. මෙම පාඨකයින්ගේ හැසිරීම පිළිබඳ දීපව්‍යාප්ත පුළුල් සමීක්ෂණයක් මෑත කාලයක සිදුවී නොමැති බව සඳහන් කළ යුතුය.

1997-1998 කාලපරිච්ඡේදය තුළදී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා කොළඹ විශ්වවිද්‍යාලයීය සමාජවිද්‍යා අධ්‍යයනාංශය විසින් අවසන්වරට ක්‍රියාත්මක කළ පාඨක සමීක්ෂණ ඔස්සේ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් පළාත් ආවරණය වන පරිදි පාඨකයන්ගේ කියවීමේ රුචිකත්වය සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සිදු විය. මේ වන තෙක් කියවීමේ රුචිකත්වය සම්බන්ධව හා එහි කාලීන ප්‍රවණතා මෙන්ම ඒ පිළිබඳව තොරතුරුවල පවතින හිඟතාවය මත මෙවැනි කාලීන සමීක්ෂණයක් පැවැත්වීමට හේතු විය. ශ්‍රී ලංකාවේ වර්තමානය වනවිට පවතින සාක්ෂරතා මට්ටම හා සංසන්දනය කර බලන විට ඊට සරිලන කියවීමේ පුරුද්දක් රට තුළ පවතීද යන්න විමසා බැලීම වැදගත්ය. පාඨකයින්ගේ ස්වරූපය පිළිබඳ හඳුනා ගැනීමේ අවශ්‍යතාවය ඇති පාර්ශ්ව රැසක් ද ශ්‍රී ලංකාව තුළ සිටී. පුස්තකාල වෘත්තිකයින්, අධ්‍යාපන බලධාරීන්, පොත් ප්‍රකාශකයින්, ලේඛකයින්, පොත් වෙළඳුන් හා කියවීම පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව වෙත තොරතුරු සැපයීමට මෙම සමීක්ෂණය මහෝපකාරී වේ.

### 1.5 සමීක්ෂණ සැලැස්ම

සමීක්ෂණයට අදාළව ප්‍රධාන අරමුණ හා උප අරමුණු සපුරාගැනීම, විශ්වාසදායක මට්ටමින් උපරිම ප්‍රමාණයෙන් තොරතුරු ලබා ගැනීම සහ ඒ සඳහා වැය වන කාලය පිළිබඳව සැලකිල්ලට ගෙන මෙම සමීක්ෂණය සැලසුම් කරන ලදී. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ පැවති දශක තුනක යුධමය වාතාවරණය අවසන්වීමෙන් පසු සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි පවත්වන පළමු පාඨක සමීක්ෂණය මෙය වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතට ගැනෙන මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ජීවත් වන සහ මහජන පුස්තකාල පාඨකයින්ගේ ප්‍රජා විද්‍යාත්මක, සමාජීය හා ආර්ථික සාධක කෙරෙහි ද අවධානය යොමු කරමින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී.

### 1.6 නියැදිය

සමීක්ෂණයට අදාළ නියැදිය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතට ගැනෙන මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් ඇසුරින් තෝරා ගන්නා ලදී. ඒ අනුව මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාල සියල්ල නියෝජනය වන පරිදි සමානුපාත නියැදියක් මගින් මහජන පුස්තකාල භාවිත කරනු ලබන පාඨකයන් ආශ්‍රයෙන් දත්ත රැස් කරන ලදී. තෝරා ගත් නියැදියට ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මහජන පුස්තකාල භාරව කටයුතු කරන පුස්තකාලයාධිපතිවරුන් මගින් යොමු කර දත්ත රැස් කිරීම සිදු විය. ප්‍රශ්නාවලි තැපැල් මාර්ගිකව යොමු කිරීමට තෝරා ගත් මහජන පුස්තකාල සංඛ්‍යාව 334 ක් වන අතර පාඨක සංඛ්‍යාව 11,125ක් වේ.

වගු අංක 01 : පළාත් / දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතනවලින් තෝරා ගත් පාඨක නියැදිය

| පළාත/දිස්ත්‍රික්කය | නියැදි තරම | | | නියැදි එකතුව |
|---|---|---|---|---|
| | මහනගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා | |
| **බස්නාහිර පළාත** | | | | |
| කොළඹ | 500 | 250 | 75 | 825 |
| ගම්පහ | 200 | 250 | 300 | 750 |
| කළුතර | - | 200 | 300 | 500 |
| **මධ්‍යම පළාත** | | | | |
| මහනුවර | 100 | 200\| | 425 | 725 |
| මාතලේ | 200 | - | 275 | 475 |
| නුවර එළිය | 100 | 100 | 125 | 325 |
| **දකුණු පළාත** | | | | |
| ගාල්ල | 100 | 100 | 425 | 625 |
| මාතර | 100 | 50 | 375 | 525 |
| හම්බන්තොට | 100 | 50 | 250 | 400 |
| **උතුරු පළාත** | | | | |
| යාපනය | 100 | 150 | 325 | 575 |
| මන්නාරම | - | 50 | 100 | 150 |
| වවුනියාව | - | 50 | 100 | 150 |
| මුලතිව් | - | - | 100 | 100 |
| කිලිනොච්චිය | - | - | 75 | 75 |
| **නැගෙනහිර පළාත** | | | | |
| මඩකලපුව | 200 | 100 | 225 | 525 |
| අම්පාර | 100 | 50 | 425 | 575 |
| ත්‍රිකුණාමලය | - | 100 | 275 | 375 |
| **උතුරුමැද පළාත** | | | | |
| අනුරාධපුරය | 100 | - | 450 | 550 |
| පොළොන්නරුව | - | - | 175 | 175 |
| **වයඹ පළාත** | | | | |
| කුරුණෑගල | 100 | 50 | 475 | 625 |
| පුත්තලම | - | 100 | 250 | 350 |
| **ඌව පළාත** | | | | |
| බදුල්ල | 200 | 50 | 375 | 625 |
| මොණරාගල | - | - | 250 | 250 |
| **සබරගමුව පළාත** | | | | |
| රත්නපුරය | 100 | 100 | 350 | 550 |
| කෑගල්ල | - | 50 | 275 | 325 |
| **එකතුව** | **2,300** | **2,050** | **6,775** | **11,125** |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

## 1.7 දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය

තෝරා ගත් නියැදියට අදාළ දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික දත්ත මූලාශ්‍රයක් ලෙස ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගත් අතර එම ප්‍රශ්නාවලී තැපැල් මාර්ගිකව ඒ ඒ පළාත් පාලන ආයතනවල මහජන පුස්තකාල නියෝජනය වන පරිදි යොමු කරන ලදී. ද්විතීක දත්ත මූලාශ්‍ර ලෙස ආශ්‍රිත ග්‍රන්ථ, සඟරා, පර්යේෂණ ලිපි හා වෙබ් අඩවි භාවිත කෙරිණි.

සමීක්ෂණය ඔස්සේ ලබාගත් දත්ත ඇතුළත් කිරීමට හා විශ්ලේෂණය සඳහා SPSS මෘදුකාංගය (Statistical Package for Social Sciences) ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද දත්ත පදනමක් හරහා ප්‍රශ්නාවලී 8,988කට අදාළ දත්ත ඇතුළත් කරන ලදී. එම දත්ත අවශ්‍ය ආකාරයට සංස්කරණය කිරීම ද සිදු කෙරිණි. සමීක්ෂණයට අදාළ අරමුණු හා ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි විශ්ලේෂණය කරන ලද දත්ත වගු, ප්‍රස්ථාර හා රූප සටහන් භාවිතයෙන් ඉදිරිපත් කිරීම සිදු විය.

# දෙවන පරිච්ඡේදය

# දත්ත විශ්ලේෂණය

## 2.1 පාඨකයන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

### 2.1.1 ස්ත්‍රී / පුරුෂ භාවය

වගු අංක 02 : පාඨකයින්ගේ ව්‍යාප්තිය - ස්ත්‍රී / පුරුෂ භාවය අනුව

| ස්ත්‍රී / පුරුෂ භාවය | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ස්ත්‍රී | 5,970 | 66.43 |
| පුරුෂ | 2,997 | 33.34 |
| සඳහන් කර නොමැති | 21 | 0.23 |
| එකතුව | 8,988 | 100 |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල පරිහරණය කරනු ලබන පාඨකයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සලකා බැලීමේදී හඳුනා ගත හැකි වන්නේ සමස්ත පාඨකයන් ප්‍රමාණය වන 8,988 අතුරින් 5,970ක පාඨක ප්‍රමාණයක් එනම් 66.4%ක් ස්ත්‍රී පාර්ශවය වන අතර 2,997 ක පාඨක ප්‍රමාණයක් (33.3%) පුරුෂ පාර්ශවය වන බවයි.




ප්‍රස්තාර අංක 01 : ස්ත්‍රී/පුරුෂ භාවය අනුව පාඨකයින්ගේ ව්‍යාප්තිය
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

එමෙන්ම ස්ත්‍රී පුරුෂ භාවය, පළාත් පාලන ආයතන හා සංසන්දනය කර බැලීමේදී ප්‍රතිචාර ලබා දුන් පාඨකයන් පිළිබඳව මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී.

වගු අංක 03 : ස්ත්‍රී/පුරුෂ භාවය තුළ පළාත් පාලන ආයතනයන්හි නියෝජනය

| පළාත් පාලන ආයතනය | ස්ත්‍රී | පුරුෂ | සඳහන් කර නොමැති | එකතුව |
|---|---|---|---|---|
| මහනගර සභා | 964 (16.15%) | 622 (20.75%) | 5 (23.81%) | 1,591 (17.71%) |
| නගර සභා | 958 (16.05%) | 633 (21.12%) | 2 (9.52%) | 1,593 (17.72%) |
| ප්‍රාදේශීය සභා | 4,048 (67.80%) | 1,742 (58.12%) | 14 (66.67%) | 5,804 (64.57%) |
| එකතුව | 5,970 (66.43%) | 2,997 (33.34%) | 21 (0.23%) | 8,988 (100%) |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ස්ත්‍රී/පුරුෂ භාවය අනුව පාඨකයන් වැඩිම ප්‍රමාණයක් ප්‍රාදේශීය සභා ආශ්‍රිතව හඳුනා ගත හැකි වේ. ඒ අනුව ප්‍රාදේශීය සභා ආශ්‍රිතව 69.74%ක ඉහළ ස්ත්‍රී පාඨක පිරිසක් නියෝජනය වන අතර 30%ක අගයක් පුරුෂ පාඨක ප්‍රජාවක් නියෝජනය වන බව අනාවරණය වේ. මහනගර සභා හා නගර සභා ආශ්‍රිතව ද එම තත්වය දැක ගත හැකිය. එමෙන්ම දිස්ත්‍රික්ක අනුව ස්ත්‍රී/පුරුෂ පාඨක නියෝජනය පිළිබඳව සළකා බැලූ අතර එහිදී ද හඳුනා ගත හැකි වන්නේ යාපනය දිස්ත්‍රික්කයේ හැර අනෙක් සෙසු සියලු දිස්ත්‍රික්ක ආශ්‍රිතව ස්ත්‍රී පාඨක නියෝජනය පුරුෂ පාඨක නියෝජනයට වඩා වැඩි අගයක් ගන්නා බවයි. නමුත් යාපනය දිස්ත්‍රික්කයේ එම අගය ස්ත්‍රී 42% ක් හා පුරුෂ 58%ක ලෙස පුරුෂ ප්‍රතිශතයේ ඉහළ අගයක් හඳුනා ගත හැකි වේ.

### 2.1.2 පාඨකයන්ගේ ව්‍යාප්තිය - ආගම අනුව




ප්‍රස්තාර අංක 02 : පාඨකයන්ගේ ව්‍යාප්තිය - ආගම අනුව

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත ප්‍රස්තාර අංක 02 හි සඳහන් වන්නේ ආගම අනුව පාඨකයන්ගේ ව්‍යාප්තියයි. ආගම අනුව පාඨකයින්ගේ ව්‍යාප්තිය දෙස අවධානය යොමු කිරීමේදී 73.24% (6583)ක සැලකියුතු බහුතර පාඨක ප්‍රජාවක් බෞද්ධ ආගමට අයත් වේ. මුළු පාඨක ප්‍රමාණයෙන් 12.4% (1115)ක් හින්දු ආගමට අයත් වේ. 7.88% (709)ක් ඉස්ලාම් ආගමට අයත් වන අතර පාඨකයන් 6.33%(569)ක් කතෝලික/ක්‍රිස්තියානි ආගමට අයත් වේ.

### 2.1.3 පාඨකයන්ගේ ව්‍යාප්තිය - ජන වර්ගය අනුව




ප්‍රස්තාර අංක 03 : පාඨකයන්ගේ ව්‍යාප්තිය - ජන වර්ගය අනුව

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ජන වර්ගය අනුව පාඨකයන්ගේ ව්‍යාප්තිය දෙස අවධානය යොමු කිරීමේදී අනාවරණය වන්නේ සිංහල ජන වර්ගයට අයත් පාඨක ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා බවයි. එම අගය 76.80% (6910) ක් ලෙස හඳුනා ගත හැකි වේ. එමෙන්ම දෙමළ පාඨක ප්‍රජාවට අයත් ප්‍රතිශතය 14.95% (1348)ක් වන අතර මුස්ලිම් පාඨක ප්‍රමාණය 7.90% (710) ක් වේ. සෙසු ජාතීන් හා සංසන්දනය කිරීමේදී මැලේ හා බර්ගර් ප්‍රතිශතය 1%ක් තරම් අඩු අගයක් ගනී. ඒ අනුව මෙම පාඨක සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් අතරින් බහුතරයක් සිංහල ජාතිකයන් වන බව අනාවරණය වේ.

### 2.1.4 වයස් කාණ්ඩ අනුව පාඨකයන්ගේ ව්‍යාප්තිය




ප්‍රස්තාර අංක 04 : වයස් කාණ්ඩ අනුව පාඨකයන්ගේ ව්‍යාප්තිය
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මෙම පාඨක සමීක්ෂණයෙහි ප්‍රජා විද්‍යාත්මක කරුණු දෙස අවධානය යොමු කිරීමේදී පාඨකයන්ගේ වයස් සංයුතිය පිළිබඳව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මුළු පාඨක ප්‍රජාව අතරින් බහුතරයකගේ වයස අවු. 11-15 වයස් කාණ්ඩයට අයත් වේ. මෙම අගය 45% (4057) කි. එමෙන්ම 16-25 වයස් කාණ්ඩයේ ද සැලකිය යුතු ප්‍රමාණයක් එනම් 20.55% ක් වන අතර ඊට අමතරව 14.95%ක ප්‍රතිශතයක් අවු. 26-35 වයස් කාණ්ඩයට අයත් වන බව හඳුනා ගත හැකි වේ.

වයස් කාණ්ඩ අනුව ජනගහනයේ අඩුම ප්‍රතිශතයක් වාර්තා වන්නේ අවු. 36-45 වයස් කාණ්ඩයේ වන අතර එම ප්‍රතිශතය 8.74%ක් වේ. එසේම වයස් පුම්තිරි සංයුතිය දෙස අවධානය යොමු කිරීමේදී හඳුනා ගත හැකි වන්නේ වැඩිම ප්‍රතිශතයක් නියෝජනය වන අවු. 11-15 වයස් කාණ්ඩයෙන් ඉහළ ස්ත්‍රී පාඨක ප්‍රතිශතයන් (94%) වාර්තා වන අතර එහි පුරුෂ ජනගහනයේ ප්‍රතිශතය 26%ක තරම් අවම අගයක් ගනී.

### 2.1.5 පාඨකයන්ගේ අධ්‍යාපන තත්ත්වය

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ අධ්‍යාපන තත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම ද මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කරනු ලබන තවත් අරමුණක් වේ. ඒ අනුව පාඨකයන් විසින් ලබා ඇති උසස්ම අධ්‍යාපන මට්ටම පිළිබඳ සලකා බලන ලදී.




| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | 72 | 83 | 296 | 1454 | 2748 | 1026 | 164 | 2 | 136 |
| පුරුෂ | 49 | 72 | 226 | 789 | 1092 | 520 | 166 | 3 | 90 |

ප්‍රස්තාර අංක 05 : පාඨකයන්ගේ අධ්‍යාපන තත්වය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ප්‍රස්තාර අංක 05 අනුව පැහැදිලි වන්නේ ප්‍රතිචාර ලබා දුන් මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් අතරින් බහුතරයක් වන 43%ක ප්‍රතිශතයක් අ. පො. ස. (උ. පෙළ) සමත්ව ඇති බවයි. ස්ත්‍රී/පුරුෂභාවය අනුව සලකා බැලීමේදී අනාවරණය වන්නේ අ. පො. ස. (උ. පෙළ) සමත්ව ඇති බහුතරය ස්ත්‍රී පාඨකයන් වන අතර එම අගය 72%ක ප්‍රමාණයකි. 28%ක ප්‍රමාණයක් පුරුෂ පාඨකයන් වේ. ප්‍රතිචාරිකයින් විසින් දෙවනුව ලබා ඇති ඉහළම අධ්‍යාපන මට්ටම ලෙස හඳුනා ගත හැකි වන්නේ 25%ක ප්‍රතිශතයක් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) සමත්ව ඇති බවයි. නමුත් ස්ත්‍රී පුරුෂ භාවය අනුව සළකා බැලීමේදී සැලකිය යුතු වෙනසක් එහි හඳුනා ගත නොහැකි වේ. එමෙන්ම ප්‍රතිචාරිකයන් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් එනම් 17% ක ප්‍රමාණයක් උපාධි/ඩිප්ලෝමා කාණ්ඩයට අයත් වේ. එම කාණ්ඩයේ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සලකා බැලිමේදී එහි දක ගත හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ උපාධි/ඩිප්ලෝමා කාණ්ඩයට අයත් ස්ත්‍රී පාඨකයන් සංඛ්‍යාවෙන් හරි අඩක් පුරුෂ උපාධි/ඩිප්ලෝමා පාඨකයන් කාණ්ඩයට අයත් වන බවයි. එම අගයන් පිළිවෙලින් 1,026ක් හා 520ක් වේ. පශ්චාත් උපාධි ලබා ගත් පිරිස 4%කට ආසන්න අගයකි. මුලු ප්‍රතිචාරිකයින් අතරින් ඉතා සුලු පිරිසක් පාසල් අධ්‍යාපනය ලබා නොමැති පිරිස ලෙස හඳුනා ගත හැකි වේ.

**2.1.6 පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු සම්බන්ධ තොරතුරු**

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යාපන/රැකියා කටයුතු පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

වගු අංක 04 : පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු සම්බන්ධ තොරතුරු

| **දැනට නියුක්තව ඇති අධ්‍යයන/ රැකියා කටයුත්ත** | **ප්‍රතිචාර සංඛ්‍යාව** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| පාසල් ශිෂ්‍ය | 2199 | 24.46 |
| විශ්වවිද්‍යාල ශිෂ්‍ය | 644 | 7.16 |
| රැකියාවක නියුක්ත | 3158 | 35.14 |
| විශ්‍රාමික | 622 | 6.92 |
| රැකියා විරහිත | 1705 | 18.97 |
| වෙනත් අධ්‍යයන කටයුතු | 160 | 1.78 |
| අමතර පංති පැවැත්වීම | 26 | 16.25 |
| වෘත්තීය පාඨමාලා | 124 | 77.50 |
| පුහුණු පාඨමාලා | 10 | 6.25 |
| නිශ්චිත පිළිතුරක් සඳහන් කර නොමැති | 500 | 5.57 |
| එකතුව | 8,988 | 100 |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත වගු අංක 04ට අනුව අනාවරණය වන්නේ ප්‍රතිචාර දැක්වූ පාඨකයින් අතරින් බහුතර ප්‍රමාණයක් රැකියාවක නියුක්ත වන අතර එම ප්‍රතිශතය සමස්ත පාඨක ප්‍රමාණයෙන් 35.14%ක් වන බවයි. එමෙන්ම 24.46%ක සැලකිය යුතු ප්‍රතිශතයක් පාසල් ශිෂ්‍යයන් ලෙස හඳුනා ගත හැකි වේ. 18.97%කට ආසන්න ප්‍රතිශතයක් රැකියා විරහිත කොට්ඨාසයට අයත් වේ. අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් සලකා බැලීමේදී අනාවරණය වන්නේ 7.16% ක ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වන බවයි. සමීක්ෂණයට භාජනය කරන ලද මුලු පාඨක ප්‍රමාණයෙන් 6.92%කට ආසන්න ප්‍රතිශතයක් විශ්‍රාමික ගණයට අයත් වේ.




ප්‍රස්තාර අංක 06 : පාඨකයන් දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු සම්බන්ධ තොරතුරු

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ප්‍රතිචාර දැක්වූ පාඨකයන් අතරින් ඔවුන් දැනට නිරත වී ඇති වෙනත් අධ්‍යයන හා රැකියා කටයුතු දෙස අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ වෙනත් අධ්‍යයන කටයුතු ලෙස අමතර පංති පැවැත්වීම, වෘත්තීය පාඨමාලා හා පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම යන කටයුතු වල නිරත වන බවයි.

පාඨකයන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව දැනට නියුක්ත අධ්‍යයන හා රැකියා කටයුතු පිළිබඳව සලකා බැලීමේදී අවධානය යොමු කිරීම වැදගත් වේ. ස්ත්‍රී/පුරුෂ වශයෙන් සලකා බැලීමේදී ඒ ඒ කටයුතු වල නිරත වන ස්වභාවයේ පැහැදිලි වෙනස්කම් හඳුනා ගත හැකි වේ.

රැකියා විරහිත ප්‍රමාණය පිළිබඳව සලකා බැලීමේදී ස්ත්‍රී/පුරුෂ වශයෙන් පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. රැකියා වියුක්ත ස්ත්‍රී ප්‍රතිශතය 86.5% ක් තරම් ඉහළ අගයක් ගන්නා විට එහි පුරුෂ ප්‍රතිශතය 13.5% තරම් ඉතා පහළ අගයක් ගනී. විශ්වවිද්‍යාල ශිෂ්‍යය ප්‍රජාව පිළිබඳව අවධානය යොමු කිරීමේ දී අනාවරණය වන්නේ බහුතර ප්‍රතිශතයක් (73.4%) විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් වන අතර 26.6%ක ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වන බවයි.

### 2.1.7 රැකියාව/ආර්ථික කටයුත්තෙහි ස්වභාවය

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ මෙම සමීක්ෂණය හරහා ඒ ඒ පුස්තකාල ආශ්‍රිත පාඨකයන් නියුක්තවන රැකියාවේ/ආර්ථික කටයුත්තේ ස්වභාවය පිළිබඳව හඳුනා ගැනීම වැදගත් වේ.




ප්‍රස්තාර අංක 07 : පාඨකයන් දැනට නියුක්තව ඇති රැකියාව /ආර්ථික කටයුත්තෙහි ස්වභාවය
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් දැනට නියුක්ත වන රැකියාවේ/ආර්ථික කටයුත්තෙහි ස්වභාවය පිළිබඳව මෙම පාඨකයන්ගේ රැකියාවෙහි නියුක්ත ප්‍රමාණයෙන් 27.3% ක ප්‍රමාණයක් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ක්ෂේත්‍රයෙහි සේවයේ නිරත වන බව අනාවරණය වේ. පිළිවෙළින් 8% බැගින් පෞද්ගලික අංශයේ හා ස්වයං රැකියා නියුක්තයින් ලෙස තම ආර්ථික කටයුතු වල නිරත වන බව පැහැදිලි වේ. නමුත් බහුතර ප්‍රතිශතයක් මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දී නොමැති තත්වයක් ද හඳුනා ගත හැකි වේ.

## 2.2 කියවීමේ ද්‍රව්‍ය හා පුරුදු

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ මෙම සමීක්ෂණය හරහා පාඨකයන් විසින් භාවිත කරනු ලබන කියවීම් ද්‍රව්‍ය හා ඔවුන්ගේ කියවීමේ පුරුදු පිළිබඳව අධ්‍යයනය කිරීම ද මූලික අරමුණක් ලෙස සැලකිය හැක. ඒ අනුව කියවීමේදී භාවිත කරනු ලබන භාෂාව, කියවීම සඳහා භාවිත කරනු ලබන මාධ්‍ය/මාධ්‍යයන් පිළිබඳව, කියවීමට ගත කරනු ලබන කාලය, විවිධ කියවීම් ද්‍රව්‍යයන් හා එහි භාවිතයන්, අන්තර්ජාල වෙබ් පිටු භාවිතය හා කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී වඩාත්ම සැලකිලිමත් වන කරුණු පිළිබඳව මෙහිදී අවධානය යොමු කරන ලදී.

### 2.2.1 කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍ය

පුස්තකාලයක් ආශ්‍රිතව විවිධ ආකාරයේ කියවීම් ද්‍රව්‍ය අන්තර්ගත වන අතරම එම කියවීම් ද්‍රව්‍ය විවිධ භාෂා මාධ්‍යයන්ගෙන් සමන්විත වේ.

මෙම සමීක්ෂණය ඔස්සේ පාඨකයන් විසින් ඒ ඒ කියවීම් ද්‍රව්‍ය උපයෝගී කර ගන්නා අවස්ථාවලදී එම කියවීම් ද්‍රව්‍ය කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍ය/මාධ්‍යන් පිළිබඳ අවධානයට ලක් කරන ලදී.




ප්‍රස්තාර අංක 08 : පාඨකයන් විසින් කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍ය/මාධ්‍යයන්

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් ලබා දුන් ප්‍රතිචාර වලට අනුව 73.51% (6,607) ක ප්‍රමාණයක් සිංහල මාධ්‍ය තම ප්‍රමුඛ භාෂා මාධ්‍ය ලෙස භාවිතයට ගන්නා බව හෙළි විය. එමෙන්ම 19.7%කට ආසන්න ප්‍රමාණයක් දෙමළ භාෂාව කියවීම සඳහා භාවිතා කරනු ලබයි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් කියවීම 2.3%ක අඩු ප්‍රතිශතයකට සීමා වී ඇති බව අනාවරණය වේ. එමෙන්ම ලබා දුන් ප්‍රතිචාරවලට අනුව පැහැදිලි වන්නේ 2%ක හෝ ඊට අඩු ප්‍රතිශතයක් සිංහල හා දෙමළ මෙන්ම දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන් ආශ්‍රයෙන් කියවීම් කටයුතු සිදු කරනු ලබන බවයි. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය ත්‍රිත්වය කියවීම වෙනුවෙන් භාවිතා කරනු ලබන ප්‍රමාණය මුළු ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවෙන් 0.2%ක් තරම් ඉතා සුලු පිරිසක් වේ.

විශේෂයෙන්ම මහජන පුස්තකාල පළාත් පාලන ආයතන ආශ්‍රයෙන් ක්‍රියාත්මක වන බැවින් පළාත් පාලන ආයතන මට්ටමින් භාෂා මාධ්‍යය භාවිතයේ ඇති වෙනස්කම් හඳුනා ගැනීම ද මෙම අධ්‍යයනයේදී වැදගත් වේ.

වගු අංක 05 : පළාත් පාලන ආයතන මට්ටමින් කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍යය

| භාෂා මාධ්‍ය | පළාත් පාලන ආයතනය | | |
|---|---|---|---|
| | මහ නගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා |
| සිංහල | 1,105 | 1,100 | 4,402 |
| දෙමළ | 302 | 358 | 1,108 |
| ඉංග්‍රීසි | 75 | 47 | 81 |
| සිංහල හා දෙමළ | 3 | 3 | 3 |
| සිංහල හා ඉංග්‍රීසි | 58 | 35 | 87 |
| දෙමළ හා ඉංග්‍රීසි | 11 | 10 | 20 |
| සිංහල,දෙමළ හා ඉංග්‍රීසි | 6 | 3 | 12 |
| නිශ්චිත පිළිතුරක් සඳහන් කර නොමැති | 31 | 37 | 91 |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

පළාත් පාලන ආයතන ආශ්‍රිතව කියවීම සඳහා භාවිත කරනු ලබන භාෂා මාධ්‍යය/මාධ්‍යයන් තුළ විවිධත්වයක් හඳුනා ගත හැකි වේ. ඒ අනුව වෙන් වෙන්ව තනි භාෂා මාධ්‍යය ලෙස සිංහල හා දෙමළ මාධ්‍ය පමණක් තම කියවීමේ භාෂා මාධ්‍ය ලෙස භාවිත කරනු ලබන පාඨකයන් වැඩිම ප්‍රමාණයක් ප්‍රාදේශීය සභා ආශ්‍රිතව හඳුනා ගත හැකි අතර ඒවායෙහි ප්‍රතිශතය පිළිවෙළින් 67%ක් හා 63%ක් වේ. ඉංග්‍රීසි භාෂා මාධ්‍ය භාවිතය පිළිබඳ පමණක් සලකා බැලීමේදී ප්‍රාදේශීය සභා ආශ්‍රිතව වැඩි ප්‍රතිශතයක් හඳුනා ගත හැකි වේ.

නමුත් භාෂා මාධ්‍ය ත්‍රිත්වයෙහි භාවිතය පිළිබඳ සලකා බැලීමේදී පැහැදිලි වන්නේ කිසිදු පළාත් පාලන ආයතනයක් සැලකිය යුතු මට්ටමක පාඨක ප්‍රමාණයක් විසින් භාෂා මාධ්‍යයන් ත්‍රිත්වයම ආශ්‍රය කොටගෙන කියවීම් කටයුතුවල නිරත නොවන බවයි.

### 2.2.2 විවිධ මාධ්‍යයන් පරිශීලනය කිරීම

වර්තමානය වන විට කියවීමේ ද්‍රව්‍ය ලෙස විවිධ මාධ්‍යයන් භාවිතයට ගනු ලබයි. මුද්‍රිත මාධ්‍යය, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය, විද්‍යුත් මාධ්‍යය හා සමාජ මාධ්‍ය ලෙස වෙන් කොට හඳුනා ගත හැකි වේ. මෙම මාධ්‍යයන් නියෝජනය කරමින් ඒ ආශ්‍රිතව බහුලව පාඨකයන් විසින් පරිශීලනය කරනු ලබන මාධ්‍යයන් පිළිබඳව මෙම සමීක්ෂණය හරහා අධ්‍යයනයට ලක් කරන ලදී.

#### 2.2.2.1 මුද්‍රිත මාධ්‍ය භාවිතය

මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමේ සිට මේ දක්වා කාලය තුළ කිසියම් ලෙසකින් පුවත්පත්, සඟරා, පොත් යන මුද්‍රිත මාධ්‍යය සමාජයේ පැවතෙනු ලබයි. ඒ අනුව පුස්තකාල පරිශීලනයේදී පාඨකයන් විසින් මෙම මුද්‍රිත මාධ්‍යය භාවිතයට ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. ඊට මූලිකම හේතුව වන්නේ පුස්තකාලයක් තුළ අන්තර්ගත කියවීම් මාධ්‍ය අතරින් බහුතරයක් මෙම මාධ්‍ය ආශ්‍රය කොටගෙන පැවතීමයි.

මෙම සමීක්ෂණය ඔස්සේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් මුද්‍රිත මාධ්‍ය පරිශීලනය පිළිබඳව අවධානය යොමු කරන ලදී. පොත්පත්, පුවත්පත් හා සඟරා යන මුද්‍රිත මාධ්‍ය ත්‍රිත්වය ඔස්සේ එහි

පරිශීලනය සම්බන්ධයෙන් සලකාබලන ලද අතර ඒවා කෙරෙහි පාඨකයන්ගේ රුචිකත්වය පළමු, දෙවන හා තෙවන යනාදි පිළිවෙළින් විමසා බලන ලදී.




ප්‍රස්තාර අංක 09 : මුද්‍රිත මාධ්‍ය භාවිතය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මුද්‍රිත මාධ්‍ය භාවිත කරනු ලබන පාඨකයන්ගේ කැමැත්තේ අනුපිළිවෙළ පිළිබඳව සලකා බලන විට බහුතරයක් වන 74.6%ක ප්‍රතිශතයක් මුද්‍රිත මාධ්‍යයන් අතරින් පොත්පත් පරිශීලනය කිරීම තම පළමු කැමැත්ත ලෙස දක්වා ඇත. එමෙන්ම පාඨකයන්ගේ පළමු කැමැත්තේ ස්වභාවය අනුව ඔවුන් දෙවනුව හා තෙවනුව වැඩි රුචිකත්වය දක්වා තිබෙන්නේ පිළිවෙළින් පුවත්පත් (22.9%)ක් හා සඟරා (2.5%)ක් පරිශීලනය වෙනුවෙනි. ඒ අනුව මුද්‍රිත මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් සලකා බැලීමේදී පාඨකයින් වැඩි පිරිසක් පොත්පත් පරිශීලනය සඳහා පුස්තකාලය භාවිත කරනු ලබන බව පැහැදිලි වේ. දෙවන කැමැත්තේ ස්වභාවය අනුව පැහැදිලි වන්නේ බහුතර පාඨකයින් ප්‍රමාණයක් පුවත්-පත් කියවීම (62%) කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබාදී තිබෙන අතර, පොත් (19.4%) හා සඟරා (18.6%), භාවිතය කෙරෙහි ද රුචිකත්වයක් දක්වා තිබේ. තෙවන කැමැත්තේ අනුපිළිවෙළ පිළිබඳව සලකා බැලීමේදී ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව අතුරින් පිළිවෙළින් සඟරා (76.5%), පුවත්පත් (14.5%) හා පොත් (9%) භාවිත කිරීම කෙරෙහි කැමැත්තක් ඇති බවයි

.

2.2.2.2 මුද්‍රිත මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය




රූප සටහන 01 : මුද්‍රිත මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

පුවත්පත් කියවීම සඳහා වැඩිම කැමැත්තක් දක්වන පළාත ලෙස දකුණු පළාත හඳුනා ගත හැකි අතර ඒ සඳහා සමස්ත ප්‍රතිචාරිකයන් අතරින් 15.9%ක් තම කැමැත්ත ප්‍රකාශ කර තිබේ. පිළිවෙළින් බස්නාහිර (15%) හා මධ්‍යම පළාත් (14.9%) දෙවන හා තෙවන ස්ථාන හිමි කර ගනී. පුවත්පත් කියවීමේ අවම අගය වාර්තා වන්නේ උතුරු මැද පළාතින් වන අතර එහි අගය 6.1%කි.

සෙසු මුද්‍රිත මාධ්‍යයන්ට සාපේක්ෂව සඟරා පරිශීලනයට දක්වන කැමැත්ත අවම වන අතර ඉන් සඟරා කියවීමට වැඩිම කැමැත්තක් දකුණු පළාත ආශ්‍රයෙන් දැක ගත හැකි වේ. එම අගය 16.2%කි. පිළිවෙළින් මධ්‍යම (14.8%) හා බස්නාහිර (14%) පළාත් දෙවන හා තෙවන ස්ථාන හිමි කර ගනී. ඉතිරි පළාත් හත අතුරින් සඟරා කියවීමට අඩු කැමැත්තක් දක්වන පාඨක පිරිස උතුරුමැද පළාතින් හමු වන අතර එහි අගය 6.1%කි.

### 2.2.2.3 ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය

තාක්ෂණික සොයා ගැනීම්වල තවත් වර්ධනීය අවස්ථාවක් ලෙස වර්තමානය වන විට සන්නිවේදනය ප්‍රබල සමාජ අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. එමෙන්ම සන්නිවේදන මාධ්‍ය මානව ඉතිහාසයේ වර්ධනයත් සමගම ක්‍රමයෙන් දියුණු වෙමින් පැමිණ වර්තමානය වන විට ඉතා ප්‍රබල තත්වයක පසුවේ. මෙම සන්නිවේදන මාධ්‍යයන් අතරින් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමු වේ. ඒ අනුව රූපවාහිනිය හා ගුවන් විදුලිය වර්තමානය වන විට ප්‍රබල ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන මාධ්‍යයන් ලෙස හඳුනා ගත හැක.

මහජන පුස්තකාල පාඨක සමීක්ෂණය ඔස්සේ පාඨකයන් විසින් මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පරිශීලනයෙහි ස්වභාවය සම්බන්ධයෙන් අධ්‍යයනයට ලක් කරන ලදී.




ප්‍රස්තාර අංක 10 : ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත ප්‍රස්තාර අංක 10 ඔස්සේ ප්‍රතිචාරිකයන්ගේ රුචිකත්වයන් අනුව රූපවාහිනී මාධ්‍ය හා ගුවන් විදුලි මාධ්‍ය පරිශීලනයේ ස්වභාවය හඳුනා ගත හැකි වේ. ඒ අනුව ප්‍රතිචාරිකයන් විසින් මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ද්විත්වය අතරින් ප්‍රමුඛත්වයක් ලබා දී තිබෙන්නේ රූපවාහිනී මාධ්‍ය පරිශීලනය කිරීම වෙතයි. එම අගය 83.3% ක තරම් ඉහළ අගයක් ගනී. කැමැත්තේ දෙවන අනුපිළිවෙල අනුව 81.6% ක් ගුවන් විදුලි මාධ්‍ය පරිශීලනය කෙරෙහි නැඹුරුතාවක් ද දක්වා තිබේ. එමඟින් පැහැදිලි වන්නේ රූපවාහිනිය හා ගුවන් විදුලිය යන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ද්විත්වය අතුරින් රූපවාහිනී මාධ්‍ය පරිශීලනය කෙරෙහි ඔවුන් විසින් ප්‍රමුඛස්ථානයක් ලබා දී තිබෙන බවයි.

#### 2.2.2.4 විද්‍යුත් මාධ්‍ය භාවිතය

තොරතුරු සැපයීම, අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය ලබාදීම හා පෙළඹවීම යනාදි අරමුණු මුල් කරගනිමින් සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යනාදී සාධක මත පදනම්ව සන්නිවේදන කාර්යය සිදු වේ. මෙහිදී මුද්‍රිත, ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍ය මෙන්ම විද්‍යුත් මාධ්‍ය එනම් පරිගණක, අන්තර්ජාලය හා සංයුක්ත තැටි (CD,DVD,MP3) හරහා පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් අතර සන්නිවේදන කාර්යය ඉටු කරනු ලබයි. වර්තමානය වන විට සෑම රටකම පාහේ විද්‍යුත් මාධ්‍ය හා ඒ ආශ්‍රිත උපකරණ/මෙවලම් භාවිතය සඳහා පෙළඹී ඇත. ඒ අනුව මෙම සමීක්ෂණය තුළින් ද මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් විද්‍යුත් මාධ්‍ය ගණයට අයත් වන පරිගණක, සංයුක්ත තැටි හා අන්තර්ජාලය යන මාධ්‍යයන් පරිශීලනය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.




ප්‍රස්තාර අංක 11 : විද්‍යුත් මාධ්‍ය භාවිතය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත ප්‍රස්තාර අංක 11 අනුව හඳුනා ගත හැකි වන්නේ පුස්තකාලය පරිහරණය කරනු ලබන පාඨකයන් පරිගණක, සංයුක්ත තැටි හා අන්තර්ජාලය යන විද්‍යුත් මාධ්‍යය කෙරෙහි තම රුචිකත්වය පළමු, දෙවන හා තෙවන වශයෙන් තම කැමැත්තේ අනුපිළිවෙළ දක්වා තිබෙන අකාරයයි. සමස්තයක් වන පාඨකයන් 8,988ක් අතුරින් වැඩි පාඨක පිරිසක් තම පළමු කැමැත්ත ලෙස පිළිවෙළින් අන්තර්ජාලය (45.5%) භාවිතා කිරීම කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වා තිබේ. ඊට අමතරව පරිගණකය (45%) හා සංයුක්ත තැටි (CD, DVD, MP3) (9.5%) භාවිත කිරීම කෙරෙහි ද කැමැත්තක් දක්වා තිබේ. එමෙන්ම පාඨකයන් විසින් තම දෙවෙනි කැමැත්තේ අනුපිළිවෙළ ලෙස සඳහන් කර තිබෙන්නේ 41%කට ආසන්න ප්‍රතිශතයක් අන්තර්ජාලය භාවිත කිරීමට (40%) හා පරිගණකය භාවිත කිරීමට (41.1%) ද නැඹුරුතාවයක් දක්වන බවයි. 19%කට ආසන්න ප්‍රතිශතයක් සංයුක්ත තැටි භාවිතය කෙරෙහි වැඩි උනන්දුවක් දක්වා තිබේ. ප්‍රතිචාරිකයන්ගේ තෙවැනි කැමැත්තේ අනුපිළිවෙළ පිළිබඳව විමසා බැලීමේදී හඳුනා ගත හැකි වන්නේ පෙර ආකාරයට වඩා වෙනස් තත්වයකි. සංයුක්ත තැටි භාවිත කිරීම සඳහා වැඩි නැඹුරුතාවක් දක්වා තිබෙන අතර එම අගය 72% කි. නමුත් පරිගණකය හා අන්තර්ජාලය භාවිත කිරීම වෙනුවෙන් ඉතා සුළු ප්‍රතිශතයක් (11%-16%) තම කැමැත්ත ප්‍රකාශ කර තිබේ.

ඒ අනුව පැහැදිලි වන්නේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් අන්තර්ජාලය භාවිත කිරීමට වැඩි කැමැත්තක් දක්වන අතරම පරිගණකය භාවිතා කිරීම සඳහා යොමු වන බවයි.

**2.2.2.5 විද්‍යුත් මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය**




රූප සටහන 02 : විද්‍යුත් මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

විද්‍යුත් මාධ්‍ය භාවිතය පිළිබඳව සලකා බැලීමේදී පරිගණක හා අන්තර්ජාල භාවිතය සඳහා මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් වැඩි කැමැත්තක් දක්වන බව අනාවරණය විය. පළාත් මට්ටමින් පරිගණක හා අන්තර්ජාල පරිශීලනය කිරීමට දක්වන කැමැත්ත පිළිබඳව හඳුනා ගැනීමේදී අනාවරණය වන්නේ බස්නාහිර පළාත ආශ්‍රිත පාඨකයන් (පරිගණක - 15.4% හා අන්තර්ජාලය - 16.8%) ඉදිරියෙන් සිටින බවයි. ඊට අමතර පිළිවෙළින් මධ්‍යම හා දකුණු පළාත් ආශ්‍රිත පාඨකයන් විද්‍යුත් මාධ්‍යය පරිශීලනයට කැමැත්තක් දක්වන බව අනාවරණය වේ. විද්‍යුත් මාධ්‍යය පරිශීලනය සඳහා දක්වන අවම කැමැත්ත උතුරු මැද පළාතින් වාර්තා (පරිගණක - 6.2%, අන්තර්ජාලය - 6.4%) වේ.

### 2.2.2.6 සමාජ මාධ්‍යය භාවිතය

සාම්ප්‍රදායික මාධ්‍යවලට අභියෝගයක් වෙමින් වේගයෙන් ජනතාවගේ ආකර්ෂණයට ලක් වී ඇති සන්නිවේදන මාධ්‍යයක් ලෙස සමාජ මාධ්‍යය හඳුනා ගත හැකි වේ. සමාජ මාධ්‍යයන් යනු තොරතුරු හුවමාරු කර ගැනීම හා පරිභෝජනය කිරීම මගින් පුද්ගලයින් එකිනෙකා සමග එකිනෙකට සම්බන්ධ කර ගැනීමට හැකි වෙබ් සන්නිවේදන මෙවලමකි. ඒ අනුව ලින්ක්ඩ්ඉන් (LinkdIn), ෆේස්බුක් (Facebook), ට්විටර් (Twitter), යූ ටියුබ් (YouTube) වැනි සමාජ මාධ්‍ය හරහා සංසරණය වන සමාජ ජාලා වෙබ් අඩවි භාවිතය කෙරෙහි මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ ස්වභාවය පිළිබඳව මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරන ලදී.




ප්‍රස්තාර අංක 12 : සමාජ මාධ්‍ය භාවිතය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

සමාජ මාධ්‍ය පරිශීලනය පිළිබඳව අවධානය යොමු කිරීමේදී පාඨකයන්ගේ පළමු, දෙවන හා තෙවන කැමැත්ත අනුව පිළිවෙළින් තොරතුරු ලබා ගන්නා ලදී. පාඨකයන්ගේ පළමු කැමැත්ත පිළිබඳව සලකා බැලීමේදී අනාවරණය වන්නේ පිළිවෙළින් මුළු පාඨක සංඛ්‍යාවෙන් 51%ක බහුතරයක් ෆේස්බුක් (Facebook) සමාජ ජාලය භාවිත කරනු ලබන බවයි. 30.6%ක ප්‍රතිශතයක් යූ ටියුබ් (You Tube) භාවිත කරනු ලබන අතර පිළිවෙළින් වයිබර් (Viber) - 11%ක්, ඉමෝ (Imo) - 5.3% ක් හා ට්විටර් (Twitter) - 1.5%කට ආසන්න ප්‍රමාණයක් මෙන්ම

ලින්ක්ඩ්ඉන් (LinkdIn) - 0.6%කට ආසන්න ප්‍රමාණයක් භාවිත කරයි. එමෙන්ම ප්‍රතිචාරිකයන්ගේ දෙවන කැමැත්තේ අනුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කිරීමේදී හඳුනා ගත හැකි වන්නේ මුළු පාඨක සංඛ්‍යාව අතරින් 26%-28%ක් අතර ප්‍රතිශතයක් පිළිවෙළින් යූ ටියුබ් (YouTube), ෆේස්බුක් (Facebook) යන සමාජ ජාලා භාවිතයට වැඩි නැඹුරුතාවයක් දක්වන බවයි. එමෙන්ම තෙවන කැමැත්ත පිළිබඳව සලකා බැලීමේදී පිළිවෙළින් වයිබර් (Viber) - 31.9%, ඉමෝ (Imo) - 23.4% හා යූ-ටියුබ් (YouTube ) - 18.8% පරිශීලනය කිරීමට පාඨකයන් වැඩි රුචිකත්වයක් දක්වා තිබෙන බවයි.

**2.2.2.7 සමාජ මාධ්‍යය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය**

මෙම සමීක්ෂණය ඔස්සේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ සමාජ මාධ්‍යය භාවිතයෙහි හැසිරීම පිළිබඳව ද අධ්‍යයනය කළ අතර එමගින් අනාවරණය වූයේ ෆේස්බුක් (Facebook), යූ-ටියුබ් (YouTube) හා වයිබර් (Viber) යන සමාජ මාධ්‍යය පරිශීලනය ඉහළ අගයක් ගන්නා බවයි. එම සමාජ මාධ්‍ය පළාත් මට්ටමින් හැසිරීම පිළිබඳව අධ්‍යයනය කළ විට පැහැදිලිව දක්නට ලැබෙන්නේ බස්නාහිර පළාත ආශ්‍රිතව (ෆේස්බුක් - 17.7%, යූ-ටියුබ් - 16% හා වයිබර් - 15.4%) මෙම මාධ්‍යයන් පරිශීලනය කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දී තිබෙන බවයි. ෆේස්බුක් සමාජ මාධ්‍යය භාවිතය සඳහා දෙවනුව හා තෙවනුව වැඩි කැමැත්තක් දක්වනු ලබන්නේ පිළිවෙළින් නැගෙනහිර (15.1%) හා දකුණු (13.8%) පළාත් ආශ්‍රිතවය. එහි අවම අගය වාර්තා වන්නේ උතුරු මැද පළාතින් වන අතර එම අගය 6.3%කි.

යූ-ටියුබ් සමාජ මාධ්‍ය භාවිතය සඳහා පළාත් නවය අතුරින් පිළිවෙළින් දෙවන හා තෙවන වශයෙන් ප්‍රමුඛත්වය ලබා දී තිබෙන්නේ මධ්‍යම (14.6%) හා දකුණු (14.1%) පළාත් ආශ්‍රිතවය. එහි අවම අගය වාර්තා වන්නේ ඌව පළාතින් වන අතර එම අගය 6.8%කි. වයිබර් භාවිතය සඳහා පිළිවෙළින් ප්‍රමුඛත්වය ලබා දී තිබෙන්නේ මධ්‍යම (14.8%) හා උතුරු (14.8%) පළාත් ආශ්‍රිතවය. එහි අවම අගය වාර්තා වන්නේ ඌව පළාතින් වන අතර එම අගය 5.3%කි.




රූප සටහන 03 : සමාජ මාධ්‍ය භාවිතය - පළාත් අනුව ව්‍යාප්තිය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

### 2.2.2.8 වෙනත් මාධ්‍යය භාවිතය

ඉහත සඳහන් කළ මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය, විද්‍යුත් හා සමාජ මාධ්‍ය භාවිතයට අමතරව ප්‍රතිචාරකයින් විසින් පරිශීලනය කරනු ලබන වෙනත් මාධ්‍යය පිළිබඳව ද මෙම අධ්‍යයනය හරහා අවධානය යොමු කරන ලදී. ඒ අනුව මුළු ප්‍රතිචාරිකයින් අතුරින් ඉතා අවම ප්‍රමාණයක් (1.8% කට ආසන්න) වෙනත් මාධ්‍ය/මාධ්‍යයන් භාවිත කරන බවයි. එම මාධ්‍ය අතරින් 1.4% ක් වට්ස්ඇප් (WhatsApp ) මාධ්‍ය භාවිතයට කැමැත්තක් දක්වන අතර ඉතිරි පිරිස Skype, Hangout, Instagram වැනි මාධ්‍යයන් පරිශීලනයට යොමු වී ඇත. නමුත් එම අගය 1% ක වත් වඩා අඩු අගයකි.

### 2.2.3 කියවීම් ද්‍රව්‍ය භාවිතය




ප්‍රස්තාර අංක 13 : විවිධ කියවීම් ද්‍රව්‍ය භාවිතය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ප්‍රස්තාර අංක 13 අනුව පැහැදිලි වන්නේ ඉහත සඳහන් කියවීම් ද්‍රව්‍ය අතරින් නවකතා කියවීම සඳහා බහුතර පාඨක ප්‍රමාණයක් එනම් 83%ක් කැමැත්ත දක්න බවයි. එමෙන්ම 81%ක පිරිසක් පුවත්පත් කියවීම සඳහා කැමැත්තක් දක්වයි. මෙම කියවීම් ද්‍රව්‍ය පිළිබඳව පාඨකයන්ගේ ඇති කැමැත්ත පිළිබඳව අධ්‍යයනය කිරීමේදී අනාවරණය වන්නේ මුළු ප්‍රමාණයෙන් 50% හෝ ඊට වඩා වැඩි පිරිසක් පිළිවෙළින් කෙටිකතා (74%), පරිවර්තන (70%), සඟරා (69%), ආගමික ග්‍රන්ථ (67%), රහස් පරීක්ෂක කතා (66%), අධ්‍යාපනික ග්‍රන්ථ (62%), වීරකතා (60%), චරිතාපදාන (60%), අන්තර්ජාල වෙබ් පිටු (53%) සහ CD/ DVD (50%) වශයෙන් කියවීමට කැමැත්තක් දක්වන බවයි. විමර්ශන ග්‍රන්ථ (46%), පද්‍ය/ගීත (46%), නාට්‍ය/තිරපිටපත් (39%) සහ චිත්‍ර කතා (38%)ක් වෙනත් කියවීම් ද්‍රව්‍ය ලෙස තම කැමැත්ත සඳහන් කර තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනය හරහා අවබෝධ වන්නේ මහජන පුස්තකාලයක පවතින කියවීම් ද්‍රව්‍ය අතරින් නවකතා, පුවත්පත් හා කෙටිකතා පරිශීලනයට පාඨකයන් වැඩි නැඹුරුතාවයක් දක්වන බවයි.

මුළු ප්‍රතිචාරිකයින් අතරින් ඉතා සුළු පිරිසක් වෙනත් ස්වරූපයේ කියවීම් ද්‍රව්‍ය පරිශීලනය කෙරෙහි ද කැමැත්තක් දක්වන බව සඳහන් කර තිබේ. මනෝ විද්‍යාත්මක ග්‍රන්ථ, පර්යේෂණ ග්‍රන්ථ, ළමා ග්‍රන්ථ, පුරාවිද්‍යාත්මක ග්‍රන්ථ මෙන්ම තාක්ෂණය, විවිධ භාෂාවන් සම්බන්ධ ග්‍රන්ථ හා ක්‍රීඩා සම්බන්ධ ග්‍රන්ථ කියවීම කෙරෙහි ද කැමැත්තක් දක්වයි.

### 2.2.4 කියවීම සඳහා අන්තර්ජාල වෙබ් පිටු භාවිතය

වෙබ් පිටුවක් යනු වෙබ් අඩවියක් විසින් සපයනු ලබන නිශ්චිත තොරතුරු එකතුවක් වන අතර එය වෙබ් බ්‍රවුසරයක (Web Browser) ආධාරයෙන් ඉදිරිපත් කෙරේ. වෙබ් අඩවියක් සාමාන්‍යයෙන් බොහෝ වෙබ් පිටුවලින් සමන්විත වේ. මෙය සරලව අර්ථ ගැන්විය හැක්කේ සාමාන්‍ය පොතකට බැඳී ඇති කඩදාසි පිටුවල රූපකයන් ලෙසයි. බොහෝ ව්‍යාපාරික වෙබ් අඩවි, බොහෝ ප්‍රවෘත්ති, ශාස්ත්‍රීය සඟරා හා ක්‍රීඩා ආදී ක්ෂේත්‍රයන් ආවරණ වන පරිදි සකස් වූ වෙබ් අඩවි ආදිය මෙවැනි වෙබ් පිටු වලින් සමන්විත වේ. මෙම වෙබ් පිටු භාවිතය සඳහා පරිගණක (ඩෙස්ක්ටොප් /ලැප්ටොප්/ටැබ්ලට්) හා ජංගම දුරකථන භාවිත කරයි.




ප්‍රස්තාර අංක 14 : කියවීම සඳහා අන්තර්ජාල වෙබ් පිටු භාවිතය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මෙම උපකරණ භාවිතයේ අනුපිළිවෙළ පිළිබඳව සලකා බැලූවිට ලබා දී ඇති ප්‍රතිචාර අතුරින් වැඩි පාඨක සංඛ්‍යාවක් කියවීම සඳහා අන්තර්ජාල වෙබ් පිටු භාවිතය වෙනුවෙන් ජංගම දුරකතන භාවිතා කරනු ලබන බව පෙනී යයි. කැමැත්තේ අනුපිළිවෙළ අනුව ද පළමු කැමැත්ත කියවීම සඳහා ජංගම දුරකතන භාවිතයෙන් අන්තර්ජාල වෙබ් පිටුවලට පිවිසෙන බව තහවුරු වේ. එහි ප්‍රතිශතය 65% කි.

එමෙන්ම පිළිවෙළින් ඩෙස්ක්ටොප් /ලැප්ටොප් පරිගණක භාවිත කරනු ලබන ප්‍රමාණය 29.2%ක් හා ටැබ්ලට් පරිගණක භාවිත කිරීම 5.8%ක අගයක් ගන්නා බව හඳුනා ගත හැකි වේ. මෙම උපකරණ භාවිත කිරීමේ දෙවන හා තෙවන කැමැත්ත අනුව හඳුනා ගත හැකි වන්නේ මධ්‍යස්ථ අගයක් ලෙස ඩෙස්ක්ටොප්/ලැප්ටොප් පරිගණක භාවිතයට ඇති කැමැත්ත ජංගම දුරකථන භාවිතයට වඩා ඉහල අගයක් ගන්නා බවයි.

## 2.2.5 කියවීම සඳහා ගත කරනු ලබන කාලය

### 2.2.5.1 කියවීම සඳහා දිනකට ගත කරනු ලබන කාලය

වර්තමානය වන විට විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි කියවීම් ද්‍රව්‍ය පවතින අතර මෙම කියවීම් ද්‍රව්‍ය විවිධ ක්‍රම/උපකරණ හා මෙවලම් ආශ්‍රයෙන් කියවීමට පාඨකයන්/පුද්ගලයන් කටයුතු කරයි. මෙම අධ්‍යයනය ඔස්සේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් සාමාන්‍යයෙන් කියවීම සඳහා ගත කරනු ලබන කාලය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. ඒ අනුව දිනකට කියවීම සඳහා වැය කරනු ලබන පැය ප්‍රමාණය හා සතියකට කියවීමට වැය කරනු ලබන දින ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කරන ලදී.




ප්‍රස්තාර අංක 15 : කියවීම සඳහා දිනකට වැයකරනු ලබන පැය ගණන
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ප්‍රතිචාරිකයන් විසින් ලබා දුන් තොරතුරුවලට අනුව කියවීම සඳහා දිනකට වැය කරනු ලබන කාල සීමාව පැය 1 සිට පැය 8ක් හෝ ඊට වැඩි කාල සීමාවක විසිරී පවතින බව හඳුනා ගත හැක. ඒ අතරින් කියවීම සඳහා වැය කරනු ලබන වැඩිම කාලය පැය 2ක් වශයෙන් ගණනය කළ හැකි අතර එය ප්‍රතිශතයක් ලෙස 24.8% කි. විශ්ලේෂණාත්මකව සලකා බලන විට පැහැදිළි වන්නේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් අවම වශයෙන් පැය 01 සිට පැය 03ක කාලසීමාවක් තම කියවීම් කටයුතු වෙනුවෙන් වැය කරන බවයි. ඒ අතරින් 13.2%ක ප්‍රමාණයක් සඳහන් කර තිබෙන්නේ තම කියවීම් කටයුතු සිදු කිරීමේදී ඒ සඳහා දිනකට නිශ්චිත පැය ගණනක් වෙන් කොට නොමැති බවයි.

#### 2.2.5.2 කියවීම සඳහා සතියකට ගත කරනු ලබන දින ප්‍රමාණය




ප්‍රස්තාර අංක 16 : කියවීම සඳහා සතියකට ගත කරනු ලබන දින ප්‍රමාණය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

කියවීම සඳහා ගතකරන කාලය, සතියකට දින ප්‍රමාණය වශයෙන් සලකා බැලීමේදී අනාවරණය වන්නේ දින 07 ක් කියවීම් කටයුතු සඳහා වැය කරනු ලබන බවයි. එම අගය 18% කි. එසේම දෙවනුව වැඩි පිරිසක් සඳහන් කර තිබෙන්නේ සතියකට දින 05ක (12%) ක කාලයක් කියවීම් කටයුතු වල නිරත වන බවයි. එමෙන්ම අවම දින ගණන වශයෙන් දින 01 ක් සඳහන් කර තිබෙන අතර එම අගය සමස්ත ප්‍රතිචාරිකයන් ප්‍රමාණය අතරින් 2.2% කි. සාමාන්‍යයක් ලෙස ගත් විට බහුතරයක් ප්‍රතිචාරිකයන් සතියක් තුළ දින 4-5ක කාලසීමාවක් තම කියවීම් කටයුතු සිදු කිරීමට යොමු කරන බවයි.

### 2.2.6 කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී පාඨකයන් විසින් සැලකිලිමත් වන කරුණු

කියවීම සඳහා විවිධ ආකාරයේ කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීම සිදු කරනු ලබයි. එම කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී පාඨකයන් විසින් විවිධ කරුණු කෙරෙහි සැලකිලිමත් වේ. ඒ අනුව සාමාන්‍යයෙන් කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී විෂයානුබද්ධ අවශ්‍යතාවය, කතුවරයාගේ කීර්තිනාමය, කතුවරයාට ඇති කැමැත්ත, අන්තර්ජාලයෙන් ලබා ගන්නා විස්තර, ගුරුවරුන්ගේ නිර්දේශ, පවුලේ සාමාජිකයින්ගේ උපදෙස් මිතුරන්ගේ උපදෙස්, මාතෘකාවේ ස්වභාවය හා ආකර්ෂණීය නිමාව ආදී ක්ෂේත්‍ර කෙරෙහි පාඨකයන් තම අවධානය යොමු කරනු ලබයි. මෙම සමීක්ෂණය ඔස්සේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් තම කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණුවල ස්වභාවය සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරිණි.

වගු අංක 06 : කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැළකිලිමත් වන කරුණු

| කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැළකිලිමත් වන කරුණු | ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| විෂයානුබද්ධ අවශ්‍යතාවය | 5,265 |
| කතුවරයාගේ කීර්තිනාමය | 1,622 |
| කතුවරයාට ඇති කැමැත්ත | 2,737 |
| පුවත්පත් / සඟරා මගින් ලබා ගන්නා විස්තර | 3,034 |
| අන්තර්ජාලයෙන් ලබා ගන්නා විස්තර | 1,644 |
| ගුරුවරුන්ගේ නිර්දේශ | 1,395 |
| පවුලේ සාමාජිකයින්ගේ උපදෙස් | 511 |
| මිතුරන්ගේ උපදෙස් | 500 |
| පොතෙහි අන්තර්ගත කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය (සරල බව) | 3,625 |
| මාතෘකාවේ ස්වභාවය | 2,554 |
| ආකර්ශණීය නිමාව | 1,572 |
| වෙනත් | 60 |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

කියවීම සඳහා කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැළකිලිමත් වන සාධක වල මුළු ප්‍රතිචාර සංඛ්‍යාව මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී. සමස්ථ ප්‍රතිචාරිකයන් අතුරින් වැඩිම පිරිසක් කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී වැඩි අවධානයක් යොමු කරනු ලබන්නේ විෂයානුබද්ධ අවශ්‍යතාවය අනුව (5,265) බව පෙන්වා දී ඇත. එමෙන්ම පොතෙහි අන්තර්ගත කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය (3,625) ක හා පුවත්පත්/සඟරා මගින් ලබා ගන්නා විස්තර මත පදනම්ව කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමට පෙළඹෙන බව දක්වා තිබේ.




ප්‍රස්තාර අංක 17 : කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණු, ප්‍රමුඛතා මට්ටම අනුව
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත ප්‍රස්තාර අංක 17ට අනුව පැහැදිලි වන්නේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණු ප්‍රමුඛතා මට්ටම අනුව පෙළගස්වා ඇති ආකාරයයි. පළමුව පොතෙහි අන්තර්ගත කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය (සරල බව) සැලකිල්ලට ගනිමින් කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමට ප්‍රමුඛතාව ලබා දෙන බව පැහැදිලිව හඳුනා ගත හැක.

කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී පාඨකයන් තම දෙවැනි ප්‍රමුඛතා මට්ටම අනුව මූලිකත්වය ලබා දී තිබෙන්නේ පුවත්පත්/සඟරා මගින් ලබා ගන්නා විස්තර (16.8%) මත කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමටය. එමෙන්ම තම තෙවැනි ප්‍රමුඛතා මට්ටම ලෙස පාඨකයින් වැඩි ප්‍රමාණයක් විසින් තෝරාගෙන තිබෙන්නේ පොතෙහි අන්තර්ගත කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය (සරල බව) (17.7), මාතෘකාවේ ස්වභාවය (13.7%) හා ආකර්ශනීය නිමාව (13%) යන සාධක මත පදනම්ව කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීම් සිදු කරන බවයි.

ප්‍රතිචාරිකයන් විසින් කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව ආගම, නව තාක්ෂණයේ භාවිතයන්, විනෝදාස්වාදය හා දැනුම වර්ධනය කර ගැනීම යන කරුණු කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

### 2.2.7 මහජන පුස්තකාල භාවිත කිරීමේ අරමුණු

පාඨකයින් විසින් විවිධ අවශ්‍යතා හේතු කොට ගෙන පුස්තකාල භාවිත කිරීම සිදු කරයි. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් පුස්තකාල භාවිත කිරීමේ අරමුණු පිළිබඳව අධ්‍යයනය කිරීම ද මෙම සමීක්ෂණයේ මූලික අරමුණක් විය. මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් විසින් පොත්පත් බැහැරට ගෙන යාම, පොත්පත් කියවීමට, පුවත්පත් කියවීම, තමාගේ සටහන් කියවීම හා විවේක කාලය ගත කිරීම යන විවිධ අවශ්‍යතා / අරමුණු මත පදනම්ව පුස්තකාලය භාවිත කිරීම පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී.




ප්‍රස්තාර අංක 18 : පුස්තකාල භාවිත කිරීමේ අරමුණු

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

පෙර සඳහන් කළ අරමුණු අතුරින් පොත්පත් බැහැරට ගෙනයාම සඳහා පුස්තකාලය භාවිත කිරීම තම පළමු කැමැත්ත ලෙස වැඩි පිරිසක් විසින් සඳහන් කර තිබේ. එම අගය සමස්ත ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවෙන් 50.2% කි. පළමු කැමැත්තේ දෙවන හා තෙවන කැමැත්ත වශයෙන් ප්‍රතිචාරිකයන් විසින් පෙන්වා දෙනු ලබන්නේ පිළිවෙලින් පොත්පත් කියවීමට (24.5%) හා පුවත්පත් කියවීමට (15.9%) පුස්තකාලය භාවිතා කරන බවයි.

ප්‍රතිචාරිකයන්ගේ දෙවෙනි කැමැත්තට අනුව ලබාදුන් ප්‍රතිචාර පිළිබඳව සළකා බැලිමේදී අනාවරණය වන්නේ 39.6% වන බහුතර පාඨක පිරිසක් පොත්පත් කියවීමටත් ඊට අමතරව පුවත්පත් කියවීමට (32.9%) හා පොත්පත් බැහැරට ගෙන යාම සඳහා (12.6%) මහජන පුස්තාලය භාවිත කරනු ලබන බවයි. එසේම ප්‍රතිචාරිකයන් වැඩි පිරිසක් පුවත්පත් කියවීමට (33.4%) තම තෙවැනි කැමැත්ත ලෙස පෙන්වා දී තිබේ. ඒ අනුව ලබා දී ඇති මුලු ප්‍රතිචාර දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිළි වන්නේ පොත්පත් හා පුවත්පත් කියවීම ප්‍රමුඛතම අරමුණු කරගනිමින් පාඨකයන් විසින් මහජන පුස්තකාල භාවිතා කරන බවයි.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව පුස්තකාලය භාවිත කිරීමේ වෙනත් අවශ්‍යතාවයන්/අරමුණු කිහිපයක් (1%ටත් අඩු ප්‍රතිශතයක්) ප්‍රතිචාරකයින් විසින් පෙන්වා දී තිබේ. රැකියා අවස්ථාවන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට, පරිගණක භාවිතයට, සංවාද/විවාද පැවැත්වීමට හා විවිධාකාරයේ අධ්‍යාපනික අවශ්‍යතා ඉටු කර ගැනීම වෙනුවෙන් මහජන පුස්තකාලය භාවිත කරනු ලබන බව සඳහන් කර තිබේ.

### 2.2.8 පුස්තකාලයෙන් අවශ්‍ය පොත්පත් තෝරා ගැනීමට භාවිතා කරන ක්‍රම

පාඨකයන් සඳහා අවශ්‍ය වන පොත්පත් තෝරා ගැනීම වෙනුවෙන් පුස්තකාල සූචිය පරීක්ෂා කිරීම, පුස්තකාල කාර්ය මණ්ඩලය, මිතුරන්/වැඩිහිටියන් මාර්ගයෙන් හා රාක්කය ළඟට ගොස් සොයා බැලීම යන ක්‍රම ඔස්සේ පුස්තකාලයෙන් අවශ්‍ය පොත්පත් තෝරා ගන්නා ආකාරය පිළිබඳ මෙම අධ්‍යයනය හරහා සමීක්ෂණයට ලක් කරන ලදී. අවශ්‍ය පොත්පත් තෝරා ගැනීමට භාවිත කරනු ලබන ක්‍රමවේදය පළමු, දෙවන හා තෙවන කැමැත්තේ ප්‍රමුඛතා මට්ටම් අනුව සලකා බලන ලදී.




ප්‍රස්තාර අංක 19 පොත්පත් තෝරාගැනීම සඳහා භාවිත කරනු ලබන විවිධ ක්‍රම

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත ප්‍රස්තාර අංක 19ට අනුව අනාවරණය වන්නේ පාඨකයන්ගේ පළමු කැමැත්ත අනුව බහුතරයක් වන පාඨකයන් විසින් පුස්තකාලයෙන් අවශ්‍ය පොත්පත් තෝරා ගැනීමේදී පොත් රාක්කය ළඟට ගොස් සොයා බැලීම හරහා පොත් තෝරා ගැනීමට පුරුදු වී සිටින බවයි. එම අගය සමස්ත ප්‍රතිචාරික සංඛ්‍යාවෙන් 56.6% කි.

ඊට අමතරව පළමු කැමැත්ත අනුව පාඨකයන් වැඩි කැමැත්තක් දක්වා තිබෙන්නේ පුස්තකාල සූචිය පරීක්ෂා කිරීම (23.1%) හා පුස්තකාල කාර්යමණ්ඩලයේ සහය ලබා ගැනීම (17.5%) හරහා පොත් තෝරා ගැනීමටය. ප්‍රතිචාරකයින්ගේ දෙවන කැමැත්ත පිළිබඳව අවධානය යොමු කිරීමේදී අනාවරණය වන්නේ වැඩි පාඨකයන් පිරිසක් පොත්පත් තෝරා ගැනීමේදී මූලිකත්වය ලබා දී තිබෙන්නේ පුස්තකාල කාර්යමණ්ඩලයේ සහාය ලබා ගැනීම හරහා පොත්පත් තෝරා ගැනීමටයි. එම අගය 42.8%කට ආසන්න ප්‍රතිශතයකි.

ඊට අමතරව රාක්කය ළඟට ගොස් සොයා බැලීමටත් (24.8%), මිතුරන්/වැඩිහිටියන් මාර්ගයෙන් පොත් තෝරා ගැනීමටත් (23.1%) යොමු වන බව දක්වා තිබේ. එසේම තම තෙවැනි කැමැත්ත අනුව පොත්පත් තෝරා ගැනීමේදී පුස්තකාල කාර්යමණ්ඩලයේ සහය ලබා ගැනීම ඔස්සේ පොත්පත් තෝරා ගැනීමට යොමු වන බව අනාවරණය වේ. එහි අගය 29.4% කට ආසන්න ප්‍රමාණයකි.

පෙර සඳහන් කළ ක්‍රම වලට අමතරව පොත්පත් තෝරා ගැනීමේදී අහඹු ලෙස පොත් තෝරා ගැනීමටත්, අන්තර්ජාලය භාවිතය වැනි වෙනත් ක්‍රම හරහා පොත් තෝරා ගැනීමට ඇතැම් පාඨකයන් කටයුතු කරන බව මෙම සමීක්ෂණය මගින් අනාවරණය වේ.

## 2.3 කියවීම පිළිබඳ ආකල්ප

### 2.3.1 පොත් කියවීමේ අරමුණු

විශේෂයෙන්ම පුස්තකාලය පරිශීලනය කරන අවස්ථාවලදී කියවීම් ද්‍රව්‍ය අතරින් පොත්පත් කියවීම සඳහා පාඨකයන් විසින් ප්‍රමුඛස්ථානයක් ලබා දෙයි. මෙම සමීක්ෂණය ඔස්සේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් විසින් පොත්පත් කියවීමේ අරමුණු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. එම අරමුණුවල ප්‍රමුඛතාවය මත පළමු, දෙවන හා තෙවන ලෙස කැමැත්තේ අනුපිළිවෙළ පෙළගස්වන ලදී. තොරතුරු ලබා ගැනීම, සාමාන්‍ය දැනුම වැඩි කර ගැනීම, විවේකය/විනෝදාස්වාදය, විභාගය සමත්වීම, ආගමික අරමුණු හා වෘත්තීමය අවශ්‍යතා යන අරමුණු ආශ්‍රයෙන් ඒ ඒ අරමුණුවලට ඇති කැමැත්තේ ස්වභාවය පිළිබඳව පාඨකයන්ගෙන් කැමැත්ත පිළිබඳව විමසා බලන ලදී.




ප්‍රස්තාර අංක 20 : පොත් කියවීමේ අරමුණු

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

අධ්‍යයනය හරහා ලබා ගත් දත්තවලට අනුව පැහැදිලි වන්නේ පාඨකයින්ගේ පළමු කැමැත්ත අනුව ප්‍රමුඛත්වය ලබා දී තිබෙන්නේ, තොරතුරු ලබා ගැනීම අරමුණු කර ගනිමින් පොත්පත් කියවීමේ නිරත වන බවයි. එම අගය 46.4%කි. එමෙන්ම පාඨකයන්ගේ දෙවන කැමැත්ත අනුව වැඩි අවස්ථාවක් ලබා දී තිබෙන්නේ සාමාන්‍ය දැනුම වැඩි කර ගැනීම සඳහා පොත්පත් කියවීම සිදු කරන බවයි. එම අගය සමස්ත ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවෙන් 21.8% කි. විවේකය/විනෝදාස්වාදය සඳහා (19.3%) පොත්පත් කියවීම තම අරමුණුවල තෙවන කැමැත්ත ලෙස පාඨකයන් විසින් ප්‍රමුඛතාවය ලබා දී තිබේ.

ඉහත සඳහන් කළ අරමුණු වලට අමතරව පාඨකයින් විසින් පොත්පත් කියවීම කෙරෙහි ඉවහල් වන වෙනත් අරමුණක් ලෙස තමන්ගේ ආකල්ප වෙනස් කර ගැනීම උදෙසා පොත්පත් කියවන බව සඳහන් කර තිබේ.

### 2.3.2 කියවීම පිළිබඳව පාඨකයන් විසින් දරන විවිධ මත / අදහස්

කියවීමෙන් දැනුම වර්ධනය වේ, කියවීමෙන් අත්දැකීම් ලැබේ, විභාග සාමාර්ථය සඳහා කියවීම වැදගත්ය, විනෝදාස්වාය සඳහා කියවීම වැදගත්ය සහ කියවීම නීරසය යන අදහස් සම්බන්ධයෙන් මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින්ගේ මතය විමසා බලන ලදී.




ප්‍රස්තාර අංක 21 : කියවීම පිළිබඳව පාඨකයන් විසින් දරන විවිධ මත / අදහස්
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

පාඨකයින් විසින් කියවීම පිළිබඳව ඉහත සඳහන් කරන ලද මත/අදහස් අතුරින් ඉහළ පාඨක පිරිසක් කියවීමෙන් දැනුම වර්ධනය වේ යන අදහසට එකඟතාව පළ කර ඇත. එම අගය 94% කි. එමෙන්ම දෙවනුව වැඩිම ප්‍රතිචාර හිමිව ඇත්තේ කියවීමෙන් අත්දැකීම් ලැබේ යන අදහස කෙරෙහිය. ඒ සඳහා 81%ක ප්‍රතිචාර සංඛ්‍යාවක් හිමිව තිබේ. විභාග සමාර්ථය සඳහා කියවීම වැදගත්ය සහ විනෝදාස්වාදය සඳහා කියවීම වැදගත්ය යන අදහස් කෙරෙහි පිළිවෙළින් 78% හා 73%ක ප්‍රතිචාරිකයින් ප්‍රමාණයක් තම එකඟතාවය දක්වා තිබේ.

නමුත් කියවීම නීරසය යන මතය පිළිබඳ විමසා බැලූ විට හඳුනා ගත හැකි වන්නේ 68%ක බහුතරයක් එම මතයට එකඟතාවයක් පළ කර නොමැති බවයි. එමෙන්ම 32%කට ආසන්න ප්‍රමාණයක් මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දී නොමැත.

### 2.3.3 දේශීය හා විදේශීය කර්තෘවරුන්

පාඨකයන් විසින් පොත්පත් කියවීමේදී හා තෝරා ගැනීමේදී එම පොත් රචනා කර තිබෙන කර්තෘවරයා පිළිබඳව අවධානය යොමු කරයි. මෙම පාඨක සමීක්ෂණය තුළින් මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් කැමැත්තක් දක්වනු ලබන දේශීය විදේශීය කර්තෘවරුන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. ඒ අනුව පාඨකයන් විසින් විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි කර්තෘවරුන් විශාල ප්‍රමාණයක් නම් කර තිබේ. එම කර්තෘවරුන් ක්ෂේත්‍ර කිහිපයක් යටතේ වෙන් කොට හඳුනා ගත හැක. ඒ අනුව දේශීය, විදේශීය හා භාෂා මාධ්‍යය අනුව (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) කර්තෘවරුන් වශයෙන් වෙන් කොට දැක්විය හැක. කර්තෘවරුන් පිළිබඳව සැලකීමේදී කර්තෘවරුන් විශාල සංඛ්‍යාවක් නම් කර තිබෙන බැවින් මෙහිදී මූලිකවම

පාඨකයන්ගේ කැමැත්තේ අනුපිළිවෙළ අනුව පාඨකයන් සියයක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් විසින් නම් කර තිබෙන කර්තෘවරුන් නම් කර තිබේ. සියයට වඩා අඩුවෙන් අංකනය කර ඇති කර්තෘවරුන් ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කර තිබේ.

වගු අංක 07 : දේශීය හා විදේශීය කර්තෘවරුන්

| අනු අංකය | කර්තෘවරයා | කැමැත්තේ අනුපිළිවෙල |
|---|---|---|
| 01 | මාර්ටින් වික්‍රමසිංහ | 2,602 |
| 02 | චන්දි කොඩිකාර | 944 |
| 03 | රාජේශ් කුමාර් | 894 |
| 04 | සාන්ඩිල්යන් | 892 |
| 05 | සුජීව ප්‍රසන්න ආරච්චි | 684 |
| 06 | මැක්සිම් ගෝර්කි | 560 |
| 07 | ආතර් කොනන් ඩොයිලි | 474 |
| 08 | චන්දන මෙන්ඩිස් | 457 |
| 09 | කුමාරතුංග මුනිදාස | 433 |
| 10 | යෞවන සමින්ද්‍ර | 408 |
| 11 | සුප්‍රමනියම් භාරතියාර් | 357 |
| 12 | තරංගා දිසානායක | 355 |
| 13 | එස්. වයි. මල්ලව ආරච්චි | 355 |
| 14 | ජයසේන ජයකොඩි | 336 |
| 15 | ඉක්බාල් | 251 |
| 16 | ඉනිඩ් බ්ලයින්ටන් | 244 |
| 17 | සුමිත්‍රා රාහුබද්ධ | 237 |
| 18 | කරුණාසේන ජයලත් | 236 |
| 19 | ජයකොඩි සෙනෙවිරත්න | 236 |
| 20 | රමණී බුලත්සිංහල | 235 |
| 21 | ගයනා එස්. ලක්මාලි | 228 |
| 22 | එදිරිවීර සරත්චන්ද්‍ර | 228 |
| 23 | ටී. බී. ඉලංගරත්න | 193 |
| 24 | ඩබ්. ඒ. සිල්වා | 178 |
| 25 | ලියෝ තෝල්ස්තෝයි | 167 |
| 26 | කේ. ජයතිලක | 149 |
| 27 | මොනිකා පුෂ්පකුමාරි | 148 |
| 28 | මහගම සේකර | 126 |
| 29 | බියංකා නානායක්කාර | 121 |
| 30 | වින්හස් ආයින්වාච් | 116 |
| 31 | අනුලා ද සිල්වා | 112 |
| 32 | රේරුකානේ චන්දවිමල හිමි | 112 |
| 33 | දයා රෝහණ අතුකෝරාල | 110 |
| 34 | සරත් විජේසූරිය | 102 |
| 35 | වෙනත් දෙමළ කතුවරු | 907 |
| 36 | වෙනත් සිංහල කතුවරු | 546 |
| 37 | ඉංග්‍රීසි කතුවරු | 168 |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත සඳහන් වගු අංක 07 අනුව මුළු ප්‍රතිචාරිකයන් අතරින් බහුතරයක් වන පාඨකයන් ප්‍රමාණයක් විසින් හෙළයේ මහා ගත්කරු වශයෙන් සැලකෙන මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් තමන්ගේ කැමැත්තේ ස්වභාවය අනුව ප්‍රමුඛත්වය ලබා දී තිබේ. එම අගය මුළු ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවෙන් 2,602ක් වන අතර ප්‍රතිශතයක් ලෙස එය 17.5%කි. දෙවන කැමැත්ත චන්ද්‍රි කොඩිකාර මහත්මියට ලැබී ඇති අතර ඇය වෙනුවෙන් පාඨකයන් 944ක සංඛ්‍යාවක් කැමැත්ත ප්‍රකාශ කර තිබෙන අතර එම අගය මුළු සංඛ්‍යාවෙන් 6.5%කි.

මීට අමතරව දෙමළ කර්තෘවරුන් පිළිබඳව සලකා බැලීමේදී පාඨකයන්ගේ වැඩි කැමැත්තක් රාජේෂ් කුමාර් (Rajesh Kumar ) හා සන්දිල්යාන් (Sandilyan) යන කර්තෘවරුන්ට හිමිව ඇත. පිළිවෙළින් එම අගයන් වන්නේ 894 (5.43%) ක් හා 892 (5.42%)ක් වශයෙනි.

වෙනත් කතුවරුන් දෙස අවධානය යොමු කිරීමේදී හඳුනා ගත හැකි වන්නේ පාඨකයන් විසින් වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබෙන්නේ සිංහල කතුවරුන්ට වන අතර දෙමළ කතුවරුන් ද සැලකිය යුතු පිරිසක් ප්‍රතිචාර ලබා දී ඇත. විදේශීය කතුවරුන් අතුරින් ආතර් කොනන් ඩොයිල්, ඉක්බාල් හා ඉනිඩ් බ්ලයිට්න් කෙරෙහි ප්‍රමුඛතාවයක් තිබෙන බව තහවුරු වේ.

### 2.3.4 කියවීමට වඩාත් කැමති පොත්

මෙම සමීක්ෂණය ඔස්සේ ප්‍රතිචාරිකයන්ගේ කියවීමට ඇති රුචිකත්වය හා එහි ප්‍රවණතා පිළිබඳව අධ්‍යනය කිරීමේදී කියවීමට වඩාත් කැමැත්තක් දක්වන පොත් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී. ඒ අනුව මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් කියවා ඇති පොත්පත් අතරින් වඩාත් කැමති පොත් මෙනවාද හඳුනා ගැනීම මෙහිදී සිදුවිය. වගු අංක 08 තුළ එම පොත් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

වගු අංක 08 : කියවීමට වඩාත් කැමති පොත්

| අනු අංකය | පොතේ නම | කැමැත්තේ අනුපිළිවෙල |
|---|---|---|
| 1 | මඩොල්දූව | 900 |
| 2 | ෂර්ලොක්හෝම්ස් | 826 |
| 3 | ගම්පෙරළිය | 801 |
| 4 | අම්මා | 776 |
| 5 | විෂය සමගාමී / විභාග පොත් | 624 |
| 6 | පරිවර්තන | 480 |
| 7 | බෞද්ධ පොත් | 308 |
| 8 | ළමා පොත් | 288 |
| 9 | යුගාන්තය | 251 |
| 10 | සෙංකොට්ටං | 234 |
| 11 | ගුරු ගීතය | 231 |
| 12 | අඹ යාළුවෝ | 231 |
| 13 | රහස් පරීක්ෂක කතා | 220 |
| 14 | විරාගය | 202 |
| 15 | චරිතාපදාන | 195 |
| 16 | යොවුන් නව කතා | 182 |
| 17 | කාන්තාරයේ කුසුම | 179 |
| 18 | ආගමික ග්‍රන්ථ | 177 |
| 19 | වර්ෂා | 147 |
| 20 | කළියුගය | 145 |

| | | |
|---|---|---|
| 21 | බැද්දේගම | 141 |
| 22 | සාමාන්‍ය දැනුම | 139 |
| 23 | පොන්නියන් සෙල්වම් (Ponniyin Selvam) | 136 |
| 24 | අධ්‍යාපනික පොත් | 121 |
| 25 | අපේ ගම | 120 |
| 26 | ගොලු හදවත | 113 |
| 27 | චාතුර්යා | 107 |
| 28 | බොද මීදුම් | 104 |
| 29 | මහා භාරතම් (Maha Baratham) | 100 |
| 30 | හරි පුදුම ඉස්කෝලේ | 100 |
| 31 | ගැහැණු ළමයි | 100 |
| 32 | දෙමළ නව කතා / කෙටි කතා | 954 |
| 33 | වෙනත් දෙමළ පොත් | 863 |
| 34 | වෙනත් ඉංග්‍රීසි නව කතා | 244 |

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

දේශීය, විදේශීය මෙන්ම ඒ ඒ භාෂා මාධ්‍ය අනුව සහ කියවීමට ඇති රුචිකත්වය යන සාධක සැලකිල්ලට ගනිමින් ප්‍රතිචාරිකයන් විසින් තමන් කිය වූ පොත් හා ඒ අතරින් වඩාත් කැමැති පොත් රාශියක් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට හැකි විය. ඒ අතුරින් බහුතර පාඨක පිරිසක් එනම් මුළු ප්‍රතිචාරිකයන් අතරින් 900ක පමණ ප්‍රමාණයක් මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් විසින් රචිත මඩොල්දූව ග්‍රන්ථය කියවීමට වැඩි කැමැත්තක් දක්වන බව හඳුනා ගැනීමට හැකි විය. දේශීය කතුවරුන් අතරින් ප්‍රතිචාරිකයන් විසින් වඩාත් කැමැත්තක් දැක් වූ කර්තෘවරයා ලෙස හඳුනා ගත් මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් මඩුල්දූව කෘතිය රචනා කිරීම ද විශේෂ ලක්ෂණයකි. මෙම කෘතියට අමතරව ඔහු විසින් රචිත ගම්පෙරළිය ග්‍රන්ථය කියවීම සඳහා පාඨකයින් 801 දෙනෙකු තම කැමැත්ත ප්‍රකාශ කර තිබේ.

ප්‍රතිචාරිකයන්ගේ විදේශීය පොත් සඳහා පවතින කැමැත්ත පිළිබඳව අධ්‍යයනය කිරීමේදී විදේශීය රහස් පරීක්ෂක කථා වෘතාන්තයක් වන ෂර්ලොක් හෝම්ස් කතා පෙළ කියවිම සඳහා ප්‍රතිචාරිකයන් 826 දෙනෙකු තම කැමැත්ත ප්‍රකාශක කර තිබේ. ඊට අමතරව ලෝක ප්‍රසිද්ධ නවකතාවක් වන මැක්සිම් ගෝර්කි විසින් රචනා කරන ලද අම්මා නවකතාව කියවීම සඳහා ද ඉහළ පාඨක පිරිසක් කැමැත්තක් දක්වන අතර එම අගය 776 කි.

භාෂා මාධ්‍ය අනුව වඩාත් කැමැති පොත පිළිබඳව සලකා බැලීමේදී මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වන්නේ බහුතර පාඨක ප්‍රජාවක් සිංහල භාෂා මාධ්‍ය පොත් කියවීමට වැඩි රුචිකත්වයක් දක්වන බවයි. නමුත් දෙමළ මාධ්‍ය හරහා ද පාඨකයන් කියවීමට වඩාත් රුචිකත්වයක් දක්වන පොත් කිහිපයක් හඳුනා ගැනීමට හැකියාව ලැබේ. පොන්නියන් සෙල්වම්, මහා භාරතම් වැනි ග්‍රන්ථ නිදසුන් වේ. ඊට අමතරව ද්‍රවිඩ භාෂා මාධ්‍යයෙන් පළ වූ නවකතා හා කෙටි කතා කියවීමට කැමැත්තක් දක්වන සැලකිය යුතු පාඨක පිරිසක් සිටින බව තහවුරු වේ.

කියවීමට කැමති පොත් පිළිබඳව විශ්ලේෂණය කරන විට පෙනී යන්නේ ඉහත සඳහන් කළ පොත්වලට අමතරව ප්‍රතිචාරිකයන් විසින් අධ්‍යාපනික/විෂය සමගාමී පොත්, ආගමික පොත් සහ ඉංග්‍රීසි නවකතා /කෙටිකතා කියවීම සඳහා ද කැමැත්තක් දක්වන බවයි.

එම සමීක්ෂණය හරහා දේශීය විදේශීය කර්තෘවරුන් මෙන්ම දේශීය විදේශීය පොත්පත් භාවිතය සම්බන්ධයෙන් ද පාඨකයන්ගේ කැමැත්ත විමසා බලන ලදී. විශේෂයෙන්ම සඳන් කළ යුතු වන්නේ

සමස්ත ප්‍රතිචාරිකයන්ගේ සංඛ්‍යාවෙන් බහුතරයක් ඉන්දීය ජාතික මහත්මා ගාන්ධි හා එතුමාගේ දර්ශනය, චරිතාපදානය ආශ්‍රිත පොත් කියවීමට කැමැත්තක් දක්වා ඇති බවයි. පාඨකයන් 1570කට ආසන්න පිරිසක් එතුමාගේ පොත් කියවීමට කැමැත්තක් දක්වන බව අනාවරණය කර ගැනීමට හැකි විය.

## 2.4 කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම

### 2.4.1 කියවීම් ද්‍රව්‍ය ලබා ගන්නා ක්‍රම

සමීක්ෂණය මගින් ප්‍රතිචාරිකයන් විසින් කියවීම් ද්‍රව්‍ය ලබා ගන්නා ආකාරය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. ඒ අනුව පුස්තකාලය හරහා, මිතුරන්ගෙන්, පවුලේ සාමාජිකයන්ගෙන් හා අන්තර්ජාලය යන මාධ්‍යයන් ඔස්සේ කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම හා මිල දී ගැනීම යන ක්‍රම පිළිබඳව ප්‍රතිචාරිකයන්ගේ කැමැත්තේ අනුපිළිවෙළ පළමු, දෙවන හා තෙවන ලෙස සලකා තොරතුරු ලබා ගන්නා ලදී.




ප්‍රස්තාර අංක 22 : කියවීම පිළිබඳව පාඨකයන් විසින් දරන විවිධ මත / අදහස්
මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මේ සම්බන්ධයෙන් ප්‍රතිචාරිකයන්ගේ කැමැත්තේ අනුපිළිවෙළ දෙස අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ ප්‍රතිචාරිකයන් බහුතරයක් පුස්තකාලය හරහා කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීමට කැමැත්තක් දක්වන බවයි. එම අගය 74.3% කි. එමෙන්ම ප්‍රතිචාරිකයන්ගේ පළමු කැමැත්ත අනුව අවම වශයෙන් කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා යොමු වන ක්‍රමයක් ලෙස මිතුරන් මාර්ගයෙන් කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම හඳුනා ගත හැකිය. එම අගය 4.5%කට ආසන්න වේ.

